JMC vLearning
"your virtual learning partner"

# ගිවිසුම් නීතිය

## AAT අදියර II
BLA - ව්‍යාපාර නීතිය

ප්‍රභාත් විජේසිරි
LL.B, Attorney at Law

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය Estd. 1972
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

# AAT - ගිවිසුම් නීතිය

විෂය නිර්දේශය මත බර තැබීම - 15 %

## පරිච්ඡේද අන්තර්ගතය

- ☞ ගිවිසුම් නීතිය හැඳින්වීම
- ☞ වලංගු ගිවිසුමක ප්‍රධාන අංග හෝ අවශ්‍යතාවයන්
- ☞ අර්පනය සහ ප්‍රතිග්‍රහණය
- ☞ සාධාරණ හේතුව හෝ ප්‍රතිෂ්ඨාව
- ☞ නෛතිකව බැඳෙන සම්බන්ධතා ඇතිකර ගැනීමේ චේතනාව
- ☞ කොන්දේසි, ප්‍රතිඥාභාර, අනාමික නියම සහ අසාධාරණ ගිවිසුම් නියම පනත
- ☞ පාර්ශව වල අව්‍යාජ සහමතිය
- ☞ පාර්ශව වල ශක්‍යතාව
- ☞ ගිවිසුම් ඉටුකිරීමේ සහ එහි අරමුණු නෛතික වීමේ හැකියාව
- ☞ ක්‍රියාත්මක කල නොහැකි, බලරහිත, අවලංගු කල හැකි සහ අනීතික ගිවිසුම්
- ☞ ගිවිසුමක් අවසන් කිරීම හෝ නිදහස් කිරීම කල හැක්කේ කෙසේද ?
- ☞ ගිවිසුමක් කඩ වීමෙන් පසු කල හැකි පිලියම්
- ☞ ගිවිසුම් නීතියට අදාල වෙනත් සංකල්ප - පෙරෙවිතාව, කාලාවරෝධය ආදීය

JMC VLearning "your virtual learning partner"

සැකසුම - කේ.ඩී. ප්‍රභාත් විජයසිරි ( LLB ) ( AAL )

# ගිවිසුම් නීතිය හැඳින්වීම

## ගිවිසුමක් යනු කුමක්ද ?

ඉහත පැනයට විවිධාකාරයේ සාර්ථක පිලිතුරු අපේක්ෂා කල හැකිය. සමස්ථයක් ලෙස ගත් කල ගිවිසුමක් යනු නෛතික බැඳීමක් ඇති කර ගැනීමේ චේතනාවෙන් පාර්ශවයන් දෙකක් හෝ වැඩි ප්‍රමාණයක් අතර ඇති කරගනු ලබන එකඟතාවයකි.

ශ්‍රී ලංකාවේදී ගිවිසුම් සම්බන්ධයෙන් අදාල වන්නේ රෝම ලන්දේසි නීතියයි. මෙරට ගිවිසුම් සම්බන්ධයෙන් අදාල වන ප්‍රධාන ලිඛිත නීතියක් නොමැති වුවද, වංචා වැලැක්වීමේ ආඥා පනත, කාලාවරෝධ ආඥා පනත, ලේඛණ ලියාපදිංචි කිරීමේ ආඥා පනත, රජයේ ඉඩම් පිලිබඳ ආඥා පනත, අසාධාරණ ගිවිසුම් නියම පනත ආදී සමහර අණ පනත් කිහිපයක් මෙරට ගිවිසුම් නීතිය කෙරෙහි බලපායි.

## ගිවිසුමක් ඇති කර ගත හැකි ආකාර

පහත සඳහන් ඕනෑම ආකාරයකට වලංගු ගිවිසුමක් ඇති විය හැකිය.

- වාචිකව
- ලිඛිතව
- ව්‍යංගයෙන්

## වලංගු ගිවිසුමක ප්‍රධාන අංග හෝ අවශ්‍යතාවයන්

- වලංගු අර්පනයක් සහ ප්‍රතිග්‍රහණයක් තිබිය යුතුය.
- නෛතික බැඳීමක් ඇතිකර ගැනීමේ චේතනාවක් තිබිය යුතුය.
- සාධාරණ හේතුවක් හෝ ප්‍රතිෂ්ටාවක් තිබිය යුතුය.
- පාර්ශවයන්ට ගිවිසුම් ශක්නුතාවය හෙවත් ගිවිසුම් වලට එළඹීමේ හැකියාව තිබිය යුතුය.
- පාර්ශවකරුවන් අතර අව්‍යාජ සහමතියක් ( නියම කැමැත්තක් ) තිබිය යුතුය.
- ගිවිසුමේ පරමාර්ථ නීත්‍යානුකූල විය යුතුය.
- ගිවිසුමේ සඳහන් වගන්ති නිශ්චිත විය යුතුය.
- ගිවිසුම ඉටු කල හැකි එකක් විය යුතුය.

❖ ඉහත සඳහන් අවශ්‍යතාවයන් එකක් හෝ කිහිපයක් තෘප්ත නොකරන්නේ නම් එහිදී නීතියට අනුව වලංගු ගිවිසුමක් ඇති නොවේ. ❖

## අර්පනය සහ ප්‍රතිග්‍රහණය

අර්පනයක් යනු නීතියට අනුව වලංගු ගිවිසුමකට එලඹීමේ අදහසින් යුතුව එක් පාර්ශවයක් විසින් තවත් පාර්ශවයක් වෙත කරනු ලබන ඒකපාර්ශික යෝජනාවකි. එසේත් නැතහොත්, නෛතික බැඳීමක් ඇතිකර ගැනීමේ චේතනාවෙන් යුතුව එක් පාර්ශවයක් විසින් තවත් පාර්ශවයක් වෙත කරනු ලබන ඒකපාර්ශික යෝජනාවකි.

අර්පනයක් ඉදිරිපත් කරනු ලබන පුද්ගලයා අර්පනකරු හෙවත් අර්පනදායී ලෙසත්, අර්පනය ඉදිරිපත් කරනු ලැබුවේ කවුරුන් වෙතද ( එනම්, අර්පනය ලබන පුද්ගලයා ) ඔහු අර්පනලාභියා ලෙසත් හැඳින්වේ. යම් තැනැත්තෙකුට වලංගු ප්‍රතිග්‍රහණයක් සිදු කල හැක්කේ තමා වෙත නීත්‍යානුකූල අර්පනයක් ඉදිරිපත් වී ඇත්නම් පමණි. තවද, අර්පනයක් ප්‍රතිග්‍රහණය කල විට වලංගු ගිවිසුමක් ඇතිවී පාර්ශවයන් ( එනම්, අර්පනකරු සහ අර්පනලාභියා යන දෙදෙනාම ) එම ගිවිසුමෙන් බැඳෙති.

| අර්පනය ✞ ප්‍රතිග්‍රහණය = වලංගු ගිවිසුම |
|---|

↓

**පාර්ශවයන් ඉන් බැඳේ**

## අර්පනයක මූලිකාංග

➡ අර්පනය තුල නෛතික සම්බන්ධතාවයක් ඇතිකර ගැනීමේ චේතනාවක් තිබිය යුතුයි.

**ගිබ්සන් එරෙහිව මැන්චෙස්ටර් සිටි කවුන්සිල්** නඩුවේදී එක්තරු දේපලක් විකිණීමට අදහස් කරන බවට හුදු මතයක් ප්‍රකාශ කිරීමක් අර්පනයක් නොවන බවත්, ඒ අනුව ඒ මත වලංගු ගිවිසුමක් ඇති නොවන බවත් තීරණය විය.

තවද, **හාවි එ. ෆීසි** නඩුවේදී , හාවි විසින් ෆීසි වෙත ටෙලිග්‍රෑම් පණිවිඩයක් යැවීම මගින් විමසා සිටියේ ඔබ අපට මෙම ( බම්පර් හෝල් පෙන් නැමැති ) ඉඩම විකුණනවාද ? එසේනම් එහි අවම මිල කීයද ? යනුවෙනි. ෆීසි විසින් ඊට ප්‍රතිචාර ලෙස "අඩුම මිල පවුම් 900 යි" යනුවෙන් පිලිතුරු ලබා දී තිබුණි. එම මිලට එය මිලදී ගැනීමට හාවි එකඟ වූ නමුත් අදාල අවම විකුණුම් මිල සටහන් කිරීම අර්පනයක් නොව , තමන්ගෙන් අසන ලද ප්‍රශ්ණයකට ලබා දුන් හුදු පිලිතුරු සැපයීමක් පමණක් වන බැවින් එම පිලිතුර මත වලංගු ගිවිසුමක් ඇති නොවන බව තීරණය විය. **ඒ අනුව ප්‍රශ්ණයකට හුදු පිලිතුරු ලබා දීමක් අර්පනයක් නොවේ.**

➡ අර්පනය පැහැදිලි සහ නිශ්චිත විය යුතුය.

**Gunthing Vs. Lynn** නඩුවේදී අශ්වයෙකු මිලදී ගැනීම සඳහා සිදුකරන ලද අර්පනයක සඳහන් වූයේ අදාල අශ්වයා තුරඟ තරඟ ජයගැනීමට තරම් වාසනාවන්ත සතෙකු වුවහොත් වැඩිපුර පවුම් තිහක් ගෙවන බවයි. මිලදී ගත් එම අශ්වයා තරඟ ජයග්‍රහණය කල පසුව අර්පනකරු විසින් පවුම් තිහ නොගෙවීම මත පැවරූ මෙම නඩුවේදී අධිකරණය තීරණය කලේ " අදාල අශ්වයා තුරඟ තරඟ ජයගැනීමට තරම් වාසනාවන්ත සතෙකු වුවහොත් " යන වාක්‍ය ඛණ්ඩය සැලකීමේදී එම අවිනිශ්චිත එකක් වන බැවින් සහ එම කොටස මගින් අදාල අර්පනය ව්‍යාකූල තත්වයට පත් කරන බැවින් එය වලංගු අර්පනයක් නොවන බවයි.

➡ අර්පනය ප්‍රතිග්‍රහණයට පෙර අර්පනලාභියා වෙත සන්නිවේදනය වී තිබිය යුතුය.

අර්පනයක් ප්‍රතිග්‍රහණයෙන් වලංගු ගිවිසුමක් ඇති වීමට නම්, එය ප්‍රතිග්‍රහණය කරන මොහොතේදී අර්පනලාභියා විසින් එම අර්පනය පිලිබඳව දැනුවත්ව සිටිය යුතුය. වෙනත් ආකාරයකට ප්‍රකාශ කලහොත් අර්පනයක් ප්‍රතිග්‍රහණයෙන් වලංගු ගිවිසුමක් ඇති වීමට නම්, එය ප්‍රතිග්‍රහණය කරන මොහොතේදී අර්පනලාභියා වෙත එම අර්පනය සන්නිවේදනය වී තිබිය යුතුය.

🎗( එනම්, තමා වෙත අර්පනයක් ඉදිරිපත් වී ඇති බවක් නොදැන යමෙකු විසින් අහඹු ලෙස සිදුකරන ප්‍රතිග්‍රහණයක් වලංගු ප්‍රතිග්‍රහණයක් නොවන අතර එහිදී වලංගු ගිවිසුමක් ඇති නොවේ. )🎗

අර්පනය තැපෑල මගින් සිදුකරන අවස්ථාවකදීද අර්පනය සහිත ලිපිය තැපැල් කිරීම පමණක් ප්‍රමාණවත් නොවන අතර ඒ මත වලංගු ගිවිසුමක් ඇති වීම සඳහා අර්පනය සහිතත ලිපිය අර්පනලාභියා වෙත ලඟා විය යුතුය.

**<u>බ්ලූම් එරෙහිව ඇමෙරිකන් ස්විස් වොච් කම්පනි</u>**

සමාගමක සොරකම් කරන ලද භාණ්ඩ පිලිබඳව නිවැරදි තොරතුරු සපයන්නෙකුට ත්‍යාගයක් පිරිනමන බවට අදාල සමාගම විසින් පලකරන ලද දැන්වීම පිලිබඳව නොදැන අයෙකු විසින් සොරබඩු පිලිබඳව නිවැරදි තොරතුරක් ලබා දී තිබුණි. අධිකරණය මෙහිදී තීරණය කලේ අදාල ත්‍යාග මුදල ලබාගැනීම සඳහා ඔහුට හිමිකමක් ..............................................................

..............................................................................................................................

අර්පනයක් කල හැකි ආකාර පහත පරිදි වේ.

▶ එක් පුද්ගලයෙක් විසින් → තවත් පුද්ගලයෙකුට

උදා -...................................................................................................................

.........................................................................................................................

▶ එක් පුද්ගලයෙක් විසින් → පුද්ගල කණ්ඩායමකට

උදා -...................................................................................................................

.........................................................................................................................

▶ එක් පුද්ගලයෙක් විසින් → මුලු මහත් ලෝකයටම

උදා -...................................................................................................................

.........................................................................................................................

.........................................................................................................................

**<u>කාර්ලයිල් එරෙහිව කාබොලික් ස්මොක් බෝල් සමාගම</u>**

ඖෂධීය දුම්කැටි වර්ගයක් නිෂ්පාදනය කල කාබොලික් ස්මෝක් බෝල් සමාගම ඒ පිලිබඳව පුවත්පත් දැන්වීමක් පල කලේ සෙම්ප්‍රතිශ්‍යාවෙන් පෙලෙන අයෙකු විසින් එම දුම්කැටි වර්ගය එහි දවටනයේ සඳහන් ආකාරයට භාවිතා කලහොත් සෙම්ප්‍රතිශ්‍යාව සුව වන බවත් නැවත කිසි දිනක එම රෝගය නොවැලඳෙන බවත්ය. එසේ මෙම නිෂ්පාදනය නිසි පරිදි භාවිතයෙන් පසු නැවත එම රෝගය වැලදුණහොත් පවුම් 100 ක මුදලක් අදාල තැනැත්තා වෙත ලබා දෙන බවත්, දැනටමත් ඒ සඳහා පවුම් 1000 ක් තම බැංකු ගිණුම් වල තැන්පත් කර ඇති බවත්ය. මෙය දුටු සෙම්ප්‍රතිශ්‍යා රෝගයෙන් පීඩා විඳි කාර්ලයිල් මහත්මිය එම දුම්කැටි වර්ගය මිලදී ගෙන එහි දවටනයේ සඳහන් ආකාරයට භාවිතා කල නමුත් ඇයට නැවත එම රෝගය වැලඳුණි. ඇය විසින් පවුම් 100 ක මුදල ඉල්ලා සිටි නමුත් සමාගම විසින් එම මුදල ගෙවීම ප්‍රතික්ෂේප කලේය. ඊට එරෙහිව පැවරූ මෙම නඩුවේදී අධිකරණය තීරණය කලේ මෙලෙස තෑගි හෝ මුදල් ලබා දෙන බවට පුවත්පත් දැන්වීම් පලකිරීම මුලුලොවටම එරෙහිව කරනු ලබන අර්පනයක් බවත් එම දැන්වීමේ සඳහන් ආකාරයට ක්‍රියාකිරීම එම අර්පනය ප්‍රතිග්‍රහණය කිරීමක් වන බවත් ඒ අනුව මෙහිදී වලංගු ගිවිසුමක් ඇතිවී ඇති බැවින් විත්තිකාර සමාගම වෙතින් අදාල මුදල අයකර ගැනීමේ අයිතියක් කාර්ලයිල් මහත්මියට ඇති බවත්ය.

## අර්පනය කිරීමට ආරාධනා කිරීම

අර්පනයකට ආරාධනා කිරීමක්, අර්පනයකින් පැහැදිලිව වෙන් කොට හඳුනා ගත යුතුය. මෙය ගිවිසුමකට ඇතුලුවීම සඳහා ඇරයුමක්, සංග්‍රහ කිරීමට ආරාධනා කිරීමක් යන නම් වලින්ද හැඳින්වේ. අර්පනය කිරීමට ආරාධනා කිරීමක් යමෙකු වෙත සිදු කල පසු එම ආරාධනාව පිලිගෙන අදාල පුද්ගලයා විසින් අර්පනයක් සිදුකරන අතර එය ප්‍රතිග්‍රහණය වූ පසු වලංගු ගිවිසුමක් ඇතිවේ.

අර්පනය කිරීමට ආරාධනා කිරීම ⇨⇨ එම ආරාධනාව පිලිගෙන අර්පනයක් ඉදිරිපත් කිරීම

වලංගු ගිවිසුමක් ඇතිවීම ⇦⇦⇦ එම අර්පනය ප්‍රතිග්‍රහණය කිරීම ⇦⇦⇦

උදාහරණ -

සාප්පුවක මිල ලකුණු කල භාණ්ඩ එහි රාක්ක මත තැන්පත් කර තැබීම

( අර්පනය කිරීමකට ආරාධනාවකි )

⬇⬇⬇

එම ආරාධනාව පිලිගෙන මුදලාලි මහතාගෙන් එම භාණ්ඩය තමා වෙත විකුණන ලෙස ඉල්ලා සිටීම

( අර්පනය කිරීමකි )

⬇⬇⬇

අර්පනලාභියා වන මුදලාලි මහතා එම අර්පනයට එකඟ වීම

( ප්‍රතිග්‍රහණය කිරීමකි ) මෙවිට වලංගු ගිවිසුමක් ඇතිවේ.

## අර්පනය කිරීමට ආරාධනා කිරීමක් ලෙස සැලකෙන අවස්ථා

☐ ස්වයංසේවා වෙලඳසැල් වල රාක්ක මත භාණ්ඩ තැන්පත් කර තිබීම

**ෆාමසියුටිකල් සොසයිටි ඔෆ් ග්‍රේට් බ්‍රිටේන් එරෙහිව බූට්ස් කෑෂ් කෙමිට්ස්** - එක්තරා නීතියක සඳහන් වූයේ එක්තරා ඖෂධයක් විකිණීම කල යුත්තේ සුදුසුකම්ලත් ඖෂධවේදියෙකුගේ අධීක්ෂණය යටතේ විය යුතු බවයි. ස්වයංසේවා වෙළඳසැලක් වූ බූට්ස් කෑෂ් කෙමිට්ස් ආයතනයෙහි රාක්කයක් මත එම වර්ගයේ ඖෂධ ගබඩා කර තිබූ අතර ඒ අසල සුදුසුකම්ලත් ඖෂධවේදියෙකු නොසිටි නමුත් මුදල් කවුන්ටරය අසල එවැන්නෙකු සිටියේය. උක්ත නීතිය කඩ කලේයැයි පදනම මත එම ආයතනයට විරුද්ධව පැවරූ මෙම නඩුවේදි අධිකරණය තීරණය කලේ මෙහිදී රාක්ක මත අදාල ඖෂධය විකිණීම සඳහා තැන්පත් කර තැබිම අර්පනයක් නොව අර්පනය කිරීමට ආරාධනා කිරීමක පමණක් වන බවත් මෙහිදී අර්පනය සහ ප්‍රතිග්‍රහණය සිදුවන්නේ මුදල් ගෙවන කවුන්ටරයේදී බවත්ය. මුදල් කවුන්ටරය අසල සුදුසුකම්ලත් ඖෂධවේදියෙකු යොදවා සිටි බැවින් බූට්ස් කෑෂ් කෙමිට්ස් ආයතනය උක්ත නීතිය කඩ කොට නොමැති බව ද තීරණය විය.

☐ සාප්පුවල මිල ලකුණු කල භාණ්ඩ විකිණීම සඳහා ප්‍රදර්ශනය කොට තැබීම.

**ෆිෂර් එරෙහිව බෙල්** - එක්තරා නීතියක් යටතේ එක්තරා පිහි වර්ගයක් විකිණීමට අර්පණය කිරීම වරදක් බව සඳහන් විය. මෙම නඩුවේ විත්තිකරු විසින් එකී වර්ගයේ පිහි තම සාප්පුවේ

ප්‍රදර්ශන කවුලුවේ මිල සඳහන් කරමින් විකිණීම සඳහා තැන්පත් කර තිබුණි. උක්ත නීතිය කඩ කළේය යන පදනම මත පැවරූ මෙම නඩුවේදී අධිකරණය තීරණය කලේ එලෙස මිල ලකුණු කළ භාණ්ඩ තැන්පත් කර තැබීම නීතියට අනුව අර්පනයක් නොව අර්පනයක් කිරීමට ආරාධනාවක් කිරීමක් පමණක් බැවින් උක්ත නීතිය මෙහිදී කඩවී නොමැති බවයි.

☐ පුවත්පත් සඟරා ආදියෙහි දැන්වීම් පලකිරීම ( තෑගි හෝ මුදල් ලබාදෙන බවට වූ දැන්වීම් හැර )

☐ භාණ්ඩ නාමාවලි

☐ වෙන්දේසියක් පවත්වන බවට වූ දැන්වීම්

**<u>හැරිස් එරෙහිව නිකර්සන්</u>** - නිශ්චිත ස්ථානයකදී නිශ්චිත දිනයකදී වෙන්දේසියක් පැවැත්වෙන බවට දැන්වීමක් පල කර තිබුණි. එම දැන්වීම පිලිබඳව උනන්දු වූ අයෙක් වෙන්දේසියට සහභාගී වීම සඳහා නියමිත දිනයේදී පැමිණි නමුත් එහිදී දැනගත හැකිවූයේ එම වෙන්දේසිය දින නියමයක් නොමැතිව කල් දමා ඇති බවයි. වෙන්දේසිය පිලිබඳ දැන්වීම අර්පනයක් බවත් තමා ඊට සහභාගී වීම ප්‍රතිග්‍රහනය බවත් ඒ අනුව ගිවිසුමක් ඇතිවූ බවත් ඒ අනුව නියමිත පරිදි වෙන්දේසිය නොපැවැත්වීම යනු ගිවිසුම් කඩ කිරීමක් වන බවත් පවසමින් එම වෙන්දේසියට සහභාගී වීම නිසා තමන්ට නිකරුණේ දරන්නට සිදුවූ වියදම් අලාභ ලෙස ලබා ගැනීම සඳහා වෙන්දෙසියට සහභාගී වූ අයෙකු විසින් පැවරූ මෙම නඩුවේදී අධිකරණය තීරණය කලේ එලෙස වෙන්දේසිය පිලිබඳ දැන්විමක් පල කිරීම අර්පනයක් කිරීමට ආරාධනා කිරීමක් විනා අර්පනයක් නොවන බවත් ඒ අනුව මෙහිදී වලංගු ගිවිසුමක් ඇතිවී නොමැති බැවින් ගිවිසුම් කඩ කිරීමක්ද සිදුවී නොමැති බැවින් වන්දි ලබා ගත නොහැකි බවයි.

☐ ටෙන්ඩර් දැන්වීම්

**<u>ස්පෙන්සර් එ. හාර්ඩිං</u>** නඩුවේදී භාණ්ඩ විකිණීමක් සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කර තිබූ අතර වැඩිම මිල ඉදිරිපත් කල තැනැත්තා වෙත අදාල ටෙන්ඩරය ලබා නොදීම පිලිබඳව පැවරූ මෙම නඩුවේදී අධිකරණය තීරණය කලේ ටෙන්ඩර් සඳහා මිලගණන් කැඳවීම, අර්පනය කිරීමට ආරාධනා කිරීමක් පමණක් වන බැවින් ඒ මත වලංගු ගිවිසුමක් ඇති නොවන බවයි.

❖❖❖ අර්පනයක් ප්‍රතිග්‍රහණයෙන් වලංගු ගිවිසුමක් ඇතිවන නමුත්, අර්පනය කිරීමට ආරාධනා කිරීමක් ප්‍රතිග්‍රහණයෙන් එලෙස වලංගු ගිවිසුමක් ඇති නොවේ. ❖❖❖

පුවත්පත් / සඟරා ආදියෙහි පලවන දැන්වීම්

| තෑගි හෝ මුදල් ලබාදෙන බවට වූ දැන්වීම් | සෙසු දැන්වීම් |
|---|---|
| ⇩⇩⇩⇩ | ⇩⇩⇩⇩ |
| ............................................................ | ............................................................ |

**<u>අර්පනයක් අවසන් වීම</u>**

JMC Learning
"your virtual learning partner"

ඕනෑම අර්පනයකට කුමන හෝ ආයු කාලයක් ඇත. අර්පනයක් කෙදිනක හෝ අවසන් විය යුතුය. පහත දැක්වෙන්නේ අර්පනයක් අවසන් විය හැකි ආකාරයන් ය.

✍● කාලය ඉකුත්ව යාමෙන් ( යම් අර්පනයක් විවෘතව පවතින කාල සීමාව එම අර්පනය තුලම සඳහන් කර ඇති අවස්ථාවකදී එකී කාල සීමාව තුල එය ප්‍රතිග්‍රහණය නොකිරීමෙන් )

තවද, අර්පනය විවෘතව පවතින කාලසීමාවක් පිලිබඳව එම අර්පනය තුල සඳහන් නොවන්නේ නම් එවන් අර්පනයක් සාධාරණ කාලසීමාවක් තුල අවසන් වේ. එහිදී අදාල සාධාරණ කාලය යන්න විශය වස්තුවේ ස්වභාවය, දෙපාර්ශවයේ ගිවිසුම් ඉතිහාසය, අවස්ථානුකූල කරුණු ආදී දේ මත තීරණය වේ.

**<u>රැම්ස්ගේට් වික්ටෝරියා හොටේල් එ. මොන්ටිෆියොරෙ</u>** නඩුවේදී හෝටල් සමාගමක කොටස් මිලදී ගැනීම සඳහා සිදු කරන ලද අර්පනයක් මාස 05 කට පසුව ප්‍රතිග්‍රහණය කොට තිබූ අතර, එසේ ප්‍රතිග්‍රහණය සඳහා මාස 05 ක් ගතකිරීම මත එම අර්පනය " සධාරණ කාලයක් තුල කල් ඉකුත්ව ඇති ලෙස " සැලකිය හැකි බවට අධිකරණය තීරණය කරන ලදී.

✍● අර්පනය ප්‍රතිග්‍රහණය කිරීමට පෙර අර්පනකරු හෝ අර්පනලාභියා මියයාමෙන්

✍● අර්පනලාභියා විසින් අර්පනය ප්‍රතික්ෂේප කිරීමෙන්

මෙය ආකාර තුනකට සිදුවිය හැකිය.

→ අර්පනලාභියා විසින් ඍජුවම අර්පනය ප්‍රතික්ෂේප කිරීමෙන්

→→ කොන්දේසි සහගත ප්‍රතිග්‍රහණයක් මගින් ( ප්‍රතිග්‍රහණය නැමැති මාතෘකාව බලන්න. )

→→→ ප්‍රතිඅර්පනයක් මගින්

ප්‍රතිඅර්පනයක් යනු අර්පනකරු විසින් තමා වෙත ඉදිරිපත් කරනු ලැබූ අර්පනය අර්පනලාභියා විසින් ඒ ආකාරයෙන්ම පිලිනොගෙන එම අර්පනයේ යම් වෙනස්කිරීමක් සහිතව නැවතත් (පෙරලා) අර්පනකරු වෙත යෝජනාවක් ඉදිරිපත් කිරීමකි. ප්‍රතිඅර්පනයක් මත මුල් අර්පනයක් අවසන් වේ.

**<u>හයිඩ් එරෙහිව රෙන්ච්</u>** - දේපලක් පවුම් 1000 කට විකිණීම සඳහා කරන ලද අර්පනයක් පිලිබඳව අර්පනලාභියාගේ ප්‍රතිචාරය වූයේ තමන් විසින් එය පවුම් 950 කට මිලදී ගැනීමට කැමති බවයි. අර්පනකරු ඊට එකඟ නොවූ අතර පසුව පවුම් 1000 කට එය මිලදී ගැනීමට අර්පනලාභියා එකඟ විය. නමුත් පවුම් 1000 කට විකිණීමට අර්පනකරු ප්‍රතික්ෂේප කල අතර අර්පනකරුගේ මුල් අර්පනය තමා විසින් ප්‍රතිග්‍රහණය කිරීම මත වලංගු ගිවිසුමක් ඇතිවූ බව පවසමින් තමා වෙත එම දේපල විකිණීම ප්‍රතික්ෂේප කිරීමට අයිතියක් නොමැති බව පවසමින් පැවරූ මෙම නඩුවේදී අධිකරණය තීරණය කලේ එම දේපල පවුම් 950 කට මිලදී ගැනීමට කැමති බව ප්‍රකාශ කිරීම ප්‍රතිඅර්පනයක් වන බවත්, ප්‍රතිඅර්පනයක් මත මුල් අර්පනය අවසන් වන බැවින් මෙහිදී වලංගු ගිවිසුමක් ඇති නොවන බවයි.

✍● ප්‍රතිග්‍රහණයට පෙර අර්පනය ඉල්ලා අස් කර ගැනීමෙන් ( ප්‍රත්‍යාදිෂ්ට කිරීමෙන් )

( අර්පනකරු විසින් අර්පනය අහෝසි කිරීමෙන් ) එම ඉල්ලා අස්කරගැනීම හෙවත් අර්පනය අහෝසිවීම පිලිබඳව අර්පනලාභියා වෙත ඍජුවම සන්නිවේදනය වීම හෝ අර්පනලාභියා වෙත විශ්වාසවන්ත තෙවන පාර්ශවයක් මගින් සන්නිවේදනය වීම ප්‍රමාණවත්ය.

**<u>ඩිකින්සන් එරෙහිව ඩොඩ්ස්</u>**

X තම දේපලක් Y ට විකිණීමට යෝජනා කල අතර අදාල අර්පන ලිපියෙහි සඳහන් වූයේ එම අර්පනය සිකුරාදා උදැසන 9.00 දක්වා විවෘත බවයි. එහෙත් එදිනට පෙර මෙම දේපල X විසින් A ට විකුණු අතර ඒ පිලිබඳව Y හට තමාට විශ්වාසවන්ත තෙවන පාර්ශවයක් වූ B මාර්ගයෙන් බ්‍රහස්පතින්දා දින දැන ගන්නට ලැබුණි.

පසුව තමා එම අර්පනය ප්‍රතිග්‍රහණය කරන බව Y විසින් X වෙත සිකුරාදා උදැසන 7.00 ට දැන්වීය. එම අර්පනය තමා විසින් ප්‍රතිග්‍රහණය කිරීමට පෙර අර්පනය අහෝසි වී ඇති බව ( එනම්, එම දේපල A ට විකුණා ඇති බව ) අර්පනලාභියා වන Y දන්නා බැවින් Y ගේ මෙම ප්‍රතිග්‍රහණය ……………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………………

.

**බයිර්න් එරෙහිව වෑන් ටියන්හෝවන්**

අර්පනකරුවෙකු විසින් අර්පනයක් සහිත ලිපියක් ඔක්තෝම්බර් 01 දින තැපෑලට දැමූ අතර එය ඔක්තෝම්බර් 11 දින අර්පනලාභියා වෙත ලැබුණු අතර ඔහු වහාම ඊට අදාල ප්‍රතිග්‍රහණය සිදු කරන ලදී. තම මුල් අර්පනය අහෝසි කරමින් අර්පනකරු විසින් ඔක්තෝම්බර් 11 දින තවත් ලිපියක් තැපැල් කල අතර එය අර්පනලාභියා වෙත ලැබුණේ ඔක්තෝම්බර් 20 දිනය. අධිකරණය මෙහිදී තීරණය කලේ මෙම දෙපාර්ශවය අතර වලංගු ගිවිසුමක් ……………………………………………………………………………………………………………………

මහජනතාව වෙත ප්‍රසිද්ධ මාධ්‍යයකින් සිදු කරන ලද අර්පනයක් එම මාධ්‍යය ඔස්සේම ඉල්ලා අස් කරගත යුතුය. තවද, එම ඉල්ලා අස්කර ගැනිම වලංගු වීම සඳහා එම පූර්ව දැන්වීම කියවා ඇති තැනැත්තෙකු වෙත සන්නිවේදනය වී තිබීම අවශ්‍ය නොවේ.

**Shuey Vs. The US Government** නඩුවේදී ජනපති ඒබ්‍රහම් ලින්කන් මහතාගේ ඝාතනය පිලිබඳව නිවැරදි තොරතුරු සපයන්නෙකුට ත්‍යාගයක් පිරිනමන බවට පුවත්පත් දැන්වීමක් පල කර තිබූ අතර, ඊට පසුව එම දැන්වීම ඉල්ලා අස්කර ගනිමින් තවත් දැනිවීමක්ද පල කර තිබුණි. මෙම නඩුවේ පැමිනිලිකරු අදාල පලමු දැන්වීම කියවා තිබුණු අතර, ඉල්ලා අස්කර ගැනීමේ දෙවන දැන්වීම කියවා නොතිබුණි. පසුව ඔහු විසින් අදාල ඝාතනය පිලිබඳව නිවැරදි තොරතුරක් ලබාදී ත්‍යාග මුදල ඉල්ලා සිටි අතර

✍● ව්‍යර්ථ වීමෙන් උදා :- තමාගේ කාර් රථය රුපියල් ලක්ෂ 20 කට විකිණීමට අමාලි විසින් තමාලි වෙත අර්පනයක් කර ඇත්නම් සහ තමාලි විසින් එම අර්පනය ප්‍රතිග්‍රහණය කිරීමට පෙර එම කාර් රථය රිය අනතුරකට ලක්ව සුණු විසුණු වී ඇත්නම් එවිට ……………………………………

……………………………………………………………………………………………………………………

✍● ප්‍රතිග්‍රහණය මගින්

## ප්‍රතිග්‍රහණය

අර්පනකරුගේ අර්පනය, අර්පනලාභියා විසින් කොන්දේසි විරහිතව පූර්ණ සහ අවසානාත්මක ලෙස පිලිගැනීම ප්‍රතිග්‍රහණයයි.

**වලංගු ප්‍රතිග්‍රහණයකට අදාල රීතීන්**

● අර්පනයක් ප්‍රතිග්‍රහණය කල යුත්තේ එම අර්පනය බලාත්මකව පවතින විටදීය. ( එනම්, කල් ඉකුත් වීමට හෝ ඉල්ලා අස් කර ගැනීමට පෙරදීය. )

● ප්‍රතිග්‍රහණය පූර්ණ සහ අනනුසීමිත ( කොන්දේසි විරහිත ) විය යුතුය.

එනම්, ප්‍රතිඅර්පනය කිරීමක් හෝ කොන්දේසි සහගත ප්‍රතිග්‍රහණයක්, නීතියට අනුව වලංගු ප්‍රතිග්‍රහණයක් නොවේ.

**<u>නීල් එරෙහිව මෙරිට්</u>**

ඉඩමක් පවුම් 280 කට විකිණීම සඳහා අර්පනකරුවෙකු විසින් කරන ලද අර්පනයක් අර්පනලාභියා විසින් ප්‍රතිග්‍රහණය කලේ මුලින් පවුම් 80 කුත්, ඉතිරිය සමාන වාරික 4 කිනුත් ගෙවන බවට පොරොන්දු වෙමිනි. අධිකරණය මෙහිදී තීරණය කලේ ..........................................

.............................................................................................................................................

.............................................................................................................................................

● අර්පනයක් ප්‍රතිග්‍රහණය කිරීම අර්පනලාභියා වෙත සන්නිවේදනය විය යුතුය. එය ලිඛිතව, වාචිකව හෝ ව්‍යංගයෙන් වුවද විය හැකිය.

● අර්පනය ප්‍රතිග්‍රහණය කල යුතු ආකාරය හෝ මාධ්‍යය එම අර්පනය තුලම සඳහන් වන්නේ නම් ඒ ආකාරයටම එය ප්‍රතිග්‍රහණය කල යුතුය.

**<u>එලියන්සන් එරෙහිව හෙන්ෂෝ</u>**

පිටි ප්‍රවාහනය කරන රථයක් මාර්ගයෙන් පිටි මිලදී ගැනීමක් පිලිබඳව අර්පන ලිපියක් අයෙකු වෙත යවා තිබූ අතර එම අර්පන ලිපියෙහි වැඩි දුරටත් සඳහන් වූයේ ඊට අදාල ප්‍රතිග්‍රහණය සහිත ලිපියද එම රථයෙන්ම ආපසු අර්පනකරු වෙත එවන ලෙසයි. වාහනයට වඩා තැපෑල වේගවත් යැයි සිතූ අර්පනලාභියා තම ප්‍රතිග්‍රහණය සහිත ලිපිය අර්පනකරු වෙත තැපැල් කලේය. එහෙත් තැපෑලේදී මෙම ලිපිය ප්‍රමාද වූ අතර අර්පනකරු වෙනත් පාර්ශවයක් වෙතින් පිටි මිලදී ගත්තේය. තමා වෙතින් පිටි මිලදී නොගැනිම මත ගිවිසුම් කඩකිරීම යටතේ අර්පනලාභියා විසින් අර්පනකරුට විරුද්ධව පැවරූ මෙම නඩුවේදී අධිකරණය තීරණය කලේ .....

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

● ප්‍රතිග්‍රහණය කල යුතු ආකාරය පිලිබඳව අර්පනය තුල සඳහන් නොවන්නේ නම් සාධාරණ ආකාරයකට එය ප්‍රතිග්‍රහණය කල හැකිය. එහිදී අදාල " සාධාරණ ආකාරය " යන්න, විෂය වස්තුවේ ස්වභාවය, දෙපාර්ශවයේ ගිවිසුම් ඉතිහාසය, අවස්ථානුගත කරුණු යන සාධක මත රඳා පවතී.

● අර්පනයක් සම්බන්ධයෙන් නිශ්ශබ්දව සිටීම වලංගු ප්‍රතිග්‍රහණයක් නොවේ. එනම්, ප්‍රතිග්‍රහණය සඳහා සක්‍රීය ක්‍රියාවක් පැවතිය යුතුය.

**<u>ෆෙල්ත්හවුස් එරෙහිව බින්ඩ්ලි</u>**

ෆෙල්ත්හවුස් විසින් තම බෑනා වෙත ලිපියක් යවමින් කියා සිටියේ බෑනා සතු අශ්වයාව ඩොලර් තිහක මුදලකට මිලදී ගැනීමට තමා මෙම ලිපිය මගින් අර්පනයක් සිදු කරන බවත් මෙම අර්පන ලිපිය පිලිබඳව වැඩිමනත් යමක් තමා වෙත බෑනාගෙන් දැනගන්නට නොලැබුණහොත් එම මිලට එම අශ්වයාව තමා වෙත විකුණූ බවට තමා සලකන බවත්ය. එම අර්පනය අනුව තම මාමා වෙත එම අශ්වයාව විකිණීමට බෑනා තීරණය කල අතර එම අශ්වයා ඒ වන විටත් බින්ඩ්ලි නැමැති

වෙන්දේසිකරුවෙකු භාරයේ සිටි බැවින් බින්ඩ්ලිව අමතා බෑනා ප්‍රකාශ කර සිටියේ එම අශ්වයාව තමා විසින් තම මාමාට විකුණා ඇති බැවින් අශ්වයාව වෙන්දේසියෙන් ඉවත් කරන ලෙසයි. එහෙත් වැරදීමකින් බින්ඩ්ලි විසින් එම අශ්වයාව විකුණූ අතර තමා සතු දේපලක් තම අවසරය නොමැතිව විකුණුවේය යන පදනම මත ෆෙල්ත්හවුස් විසින් බින්ඩ්ලිට එරෙහිව පැවරූ මෙම නඩුවේදී අධිකරණය තීරණය කලේ මෙහිදී බෑනා විසින් තම මාමාගේ අර්පනය සිතින් පමණක් ප්‍රතිග්‍රහණය කල නමුත් ඒ

පිලිබඳව අර්පනකරු වෙත සන්නිවේදනය නොකල බැවින් මෙහිදී වලංගු ප්‍රතිග්‍රහණයක් ඇතිවී නොමැති බැවින් අශ්වයා විකිණීම සම්බන්ධයෙන් වලංගු ගිවිසුමක් ඇතිවී නොමැති බවත්ය.

**<u>ප්‍රතිග්‍රහණයක් අර්පනලාභියාට සන්නිවේදනය විය යුතුය යන රීතියට ඇති ව්‍යතිරේක</u>**

1) සීඝ්‍ර තැපැල් න්‍යාය

මෙම න්‍යායට අනුව ප්‍රතිග්‍රහණය තැපෑලෙන් වන අවස්ථාවකදී වලංගු ගිවිසුමක් ඇතිවූ අවස්ථාව ලෙස සැලකෙන්නේ ප්‍රතිග්‍රහණය සහිත ලිපිය අර්පනකරු වෙත ලැබුණු අවස්ථාව නොව, අර්පනලාභියා විසින් එය තැපෑලට දැමූ අවස්ථාවයි.

මෙහිදී අදාල ලිපිය තැපෑලේදී නැතිවීම, ප්‍රමාද වීම අදාල නැත. එහෙත් තැපැල් වර්ජනයක් පවතින බව දැනදැනම ප්‍රතිග්‍රහණය සහිත ලිපිය තැපෑලට දමා ඇත්නම් එවිට සීග්‍ර තැපැල් න්‍යාය අදාල නොවේ.

**<u>ඇඩම්ස් එරෙහිව ලින්ඩ්සේ</u>** නඩුවේදී වූල් තොගයක් විකිණීම සඳහා සිදුකරනු ලැබූ අර්පන ලිපියක සඳහන් වූයේ එය ප්‍රතිග්‍රහණය කරන්නේනම් එම ප්‍රතිග්‍රහණයද හැරෙන තැපෑලෙන් සිදු කල යුතු බවයි. අර්පනලාභියා විසින් එම අර්පනය හැරෙන තැපෑලෙන් ප්‍රතිග්‍රහණය කල නමුදු අදාල ප්‍රතිග්‍රහණය සහිත ලිපිය තපෑලේදී ප්‍රමාද විය. අර්පනකරු අදාල භාණ්ඩ තොගය වෙනත් පාර්ශවයකට විකුණූ අතර, අධිකරණය මෙහිදී ප්‍රකාශ කලේ එම විකිණීම වලංගු නොවන බවත්, මෙහිදී සීඝ්‍ර තැපැල් න්‍යාය අදාල වන බවත් ඒ අනුව මුල් දෙපාර්ශවය අතර අදාල ප්‍රතිග්‍රහණය සහිත ලිපිය තැපෑලට දැමූ අවස්ථාවේදී වලංගු ගිවිසුමක් ඇතිවී හමාර බවත්ය.

ශ්‍රී ලංකාවේදී මෙම රීතිය / න්‍යාය **<u>Ceylon University Vs. Fernando</u>** නඩුවේදී පිලිගෙන ඇත.

පහත උදාහරණය සලකන්න.

A විසින් 2019.12.01 දින B වෙත ලිපියක් මගින් අර්පනයක් ඉදිරිපත් කරයි. එම B ලිපිය වෙත 2019.12.04 දින ලැබෙයි. B විසින් එම අර්පනයට අදාල ප්‍රතිග්‍රහණය සහිත ලිපිය 2019.12.15 දින තැපෑලට දමයි. එම ප්‍රතිග්‍රහණය සහිත ලිපිය වෙත 2019.12.19 දින A වෙත ලැබෙයි. සීඝ්‍ර තැපැල් න්‍යායට අනුව වලංගු ගිවිසුමක් ඇතිවන දිනය ( වලංගු ප්‍රතිග්‍රහණයක් ඇතිවන දිනය ) වන්නේ …

……………………………………………………………………………………………………………………

2) ඒකපාර්ශවික ගිවිසුම්

( උදා :- යම් ක්‍රියාවක් සිදුකල පසු තෑග්ගක් හෝ මුදලක් ලබාදෙන බවට දැන්වීම් පලකිරීමක්)

මෙවන් ගිවිසුම් වලදීද, වලංගු ගිවිසුමක් ඇතිවීම සඳහා අර්පනලාභියා විසින් අර්පනය ප්‍රතිග්‍රහණය කල බව අර්පනකරු දැනසිටීම අවශ්‍ය නොවේ.

උදා - කාර්ලයිල් නඩුව

## විශේෂ තත්වයන් යටතේ ප්‍රතිග්‍රහණයට අදාල රීතීන්

**මුහුණට මුහුණ ඇතිවන ගිවිසුමකදී ඇතිවන ප්‍රතිග්‍රහණය**

මෙහිදී වලංගු ගිවිසුමක් ඇතිවන්නේ අර්පනකරු විසින් අර්පනලාභියා වෙත කරන ලද අර්පනය අර්පනලාභියා විසින් ප්‍රතිග්‍රහණය කළ බව අර්පනකරු විසින් දැනගන්නා ( එනම්, එම ප්‍රතිග්‍රහණය අර්පනලාභියා වෙත සන්නිවේදනය වන ) මොහොතේදීය.

**දුරකථන දෙබසකදී ඇතිවන ප්‍රතිග්‍රහණය**

මෙහිදීද ඉහත රීතිය අදාල වන අතර ඒ අනුව ප්‍රතිග්‍රහණය දුරකථන මාර්ගයෙන් හුදු සම්ප්‍රේෂණය කිරීම මගින් පමණක් වලංගු ගිවිසුමක් ඇති නොවන අතර එම ප්‍රතිග්‍රහණය අර්පනලාභියා වෙත ඇසුණු බවට සහ අවබෝධ වූ බවට තහවුරු විය යුතුය.

**වලංගු ගිවිසුමක් ඇතිවන මොහොත / ස්ථානය**

සාමාන්‍යයෙන් වලංගු ගිවිසුමක් ඇතිවන මොහොත / ස්ථානය ලෙස සැලකෙන්නේ අර්පනකරු විසින් ඉදිරිපත් කරන ලද අර්පනය අර්පනලාභියා විසින් ප්‍රතිග්‍රහණය කල බව අර්පනකරු විසින් දැනගන්නා මොහොත / ස්ථානයයි. ( නමුත් සීඝ්‍ර තැපැල් න්‍යාය සහ ඒකපාර්ශවික ගිවිසුම් සම්බන්ධයෙන් මෙම රීතිය අදාල නොවේ )

**එන්ටෝර්ස් ලිමිටඩ් එරෙහිව මයිල්ස් ෆාර් ඊස්ට් කෝපරේෂන්**

මෙහිදී අර්පනකරු ලන්ඩනයේ සිට නෙදර්ලන්තයේ සිටි අර්පනලාභියා වෙත ටෙලැක්ස් යන්ත්‍රයක් මගින් අර්පනයක් සිදු කල අතර අර්පනලාභියා විසින් නෙදර්ලන්තයේ තිබූ සිය ෆැක්ස් යන්ත්‍රය මගින් එවූ පණිවිඩයක් මගින් එය ප්‍රතිග්‍රහණය කලේය. මෙහිදී වලංගු ගිවිසුමක් ඇතිවන ස්ථානය ලෙස අධිකරණය තීරණය කලේ ..........................................................................................

## සාධාරණ හේතුව හෝ ප්‍රතිශ්ඨාව

ඉංග්‍රීසි නීතියට අනුව වලංගු ගිවිසුමක් ඇතිවීම සඳහා ප්‍රතිශ්ඨාවක් තිබිය යුතු වීම අනිවාර්ය වන නමුත් රෝම ලන්දේසි නීතියට අනුව වලංගු ගිවිසුමක් ඇතිවීම සඳහා සාධාරණ හේතුවක් තිබීම ප්‍රමාණවත්ය. මෙරටදී ගිවිසුම් සඳහා බලපාන්නේ ........................................................................

.........................................................................................................................................

.........................................................................................................................................

**ලිප්ටන් එරෙහිව බුචනන්**

B ගේ පැරණි හවුල්කරුවෙකුගෙන් L වෙත අයවිය යුතු ණයක්, එම හවුල්කරුවන්ගෙන් ආපසු අයකරගැනීම සඳහා ගතහැකි සියලුම උපක්‍රම භාවිතා කර අවසන් වන තෙක් B ට එරෙහිව නඩු නොපැවරීමට L විසින් B ට පොරොන්දු විය. එහෙත් එම පොරොන්දුව / ගිවිසුම L විසින් කඩ කලේය. මේ සම්බන්ධයෙන් පැවරූ නඩුවේදී පහල අධිකරණය තීරණය කලේ B විසින් කිසිම ප්‍රතිශ්ඨාවක් ලබා දී නොමැති බැවින් L සහ B අතර ඇතිවූ ගිවිසුම වලංගු එකක් නොවන බවයි. ඊට එරෙහිව ඉදිරිපත් කල අභියාචනයේදී ඉහල අධිකරණය තීරණය කලේ L සහ B අතර ඇතිවූ එකඟතාවය / ගිවිසුම / පොරොන්දුව, ස්වේච්චාවෙන් සහ තදබල ලෙස කෙරුණු එකක් බැවින්

එම ගිවිසුම තුල සාධාරණ හේතුවක් දක්නට පවතින නිසාත්, මෙරට තුලදී ගිවිසුම් සම්බන්ධයෙන් අදාල වන්නේ රෝම ලන්දේසි නීතිය වන නිසාත් එම දෙපාර්ශවය අතර ඇතිවූ ගිවිසුම වලංගු එකක් වන බවයි.

## වලංගු ප්‍රතිශ්ඨාවක අංග

- 1. ප්‍රතිශ්ඨාව ප්‍රමාණවත් විය යුතුය ( සෑහිය යුතුය ). නමුත් අවම ප්‍රමාණවත් බවක් නියමව නොතිබිය යුතුය. එනම් අඩු වටිනාකමක් වුවද ප්‍රතිශ්ඨාවක් ලෙස සැලකිය හැකිය. චැපල් සමාගම එ.නෙස්ලේ සමාගම නඩුවේදී තීරණය වූයේ වටිනා සංගීත තැටියක් විකිනීමේ ගිවිසුමක ප්‍රතිශ්ඨාව ලෙස ඉවතලන චොක්ලට් දවටන තුනක් සෑහෙන බවයි. ( එම චොක්ලට් පාවිච්චියෙන් පසු එහි දවටන ඉවත දැමුවද, ඒවායේ යම් වටිනාකමක් ඇති බවයි. )
- 2. අතීත ප්‍රතිශ්ඨාව වලංගු ප්‍රතිශ්ඨාවක් නොවේ.
- 3. ප්‍රතිශ්ඨාව, පොරොන්දු වූ තැනැත්තාගෙන් ඉවත් විය යුතුය.
- 4. ප්‍රතිශ්ඨාව නීත්‍යානුකූල විය යුතුය.

ප්‍රතිශ්ඨාව ආකාර තුනකි.

1. අනාගත ප්‍රතිශ්ඨාව ( ඉටුකල යුතු ප්‍රතිශ්ඨාව )
2. ඉටුකල ප්‍රතිශ්ඨාව
3. අතීත ප්‍රතිශ්ඨාව - මෙය වලංගු ප්‍රතිශ්ඨාවක් නොවේ.

## නෛතික බැඳීමක් ඇතිකර ගැනීමේ චේතනාව

හුදු එකඟතාවයක් ,නීතියට අනුව ගිවිසුමක් නොවන අතර නීතියට අනුව ගිවිසුමක් ලෙස සැලකිය හැක්කේ නෛතික බැඳීමක් ඇතිකර ගැනීමේ අදහසින් දෙපාර්ශවයක් අතර ඇති වන එකඟතාවයකි. ඒ අනුව වලංගු ගිවිසුමක් තුල නෛතික බැඳීමේ චේතනාවක් තිබිය යුතුමය. දෙපාර්ශවයක් අතර නෛතික බැඳීමේ චේතනාවක් තිබේද ? නැද්ද ? යන්න සලකා බැලීම සඳහා ගිවිසුම් කොටස් දෙකකට බෙදා සලකා බැලේ.

ගිවිසුම්

| ගෘහස්ථ සහ සමාජ එකඟතා | වාණිජ ගිවිසුම් |
| --- | --- |
| පවුලේ ඥාතීන්, සමීප හිතවතුන් වැනි අය අතර ඇතිවන ගිවිසුම් වේ. | වාණිජ පරමාර්ථයෙන් ඇතිවන ගිවිසුම් වේ. |
| ⇩ | ⇩ |
| මෙවන් වර්ගයේ ගිවිසුම් තුල නෛතික බැඳීමේ නෛතික | මෙවන් වර්ගයේ ගිවිසුම් තුල |

චේතනාවක් නොමැති බවට උපකල්පනය කෙරේ. ( බැල්ෆර් නඩුව )

බැඳීමේ චේතනාවක් තිබෙන බවට උපකල්පනය කෙරේ. ( මෙරිට් නඩුව )

⇩ ⇩ ⇩ ⇩ ⇩ ⇩ ⇩ ⇩ ⇩ ⇩ ⇩

මෙම දෙවර්ගයේම උපකල්පනයන් සාක්ෂි මගින් බිඳ හෙලිය හැකිය.

**<u>බැල්ෆර් එරෙහිව බැල්ෆර්</u>**

මෙරට සේවය කළ විදේශීය යුවලක් වූ බැල්ෆර් මහතා සහ බැල්ෆර් මහත්මිය නිවාඩුවක් සඳහා තම මව් රටට ගිය අතර එහිදී බැල්ෆර් මිය අසනීප වූයෙන් බැල්ෆර් මහතා පමණක් නැවත මෙරටට පැමිණිමට සැරසුණු අතර එහිදී වැඩිදුරටත් දෙදෙනා එකඟ වූයේ බැල්ෆර් මහත්මියගේ වියපැහැදම් වෙනුවෙන් මාසික දීමනාවක් බැල්ෆර් මහතා විසින් එවන බවටයි. එහෙත් මෙම එකඟතාවය බැල්ෆර් මහතා විසින් කඩ කල අතර ඊට විරුද්ධව ගිවිසුම් කඩකිරීම නම් වරද යටතේ පැවරූ මෙම නඩුවේදී බැල්ෆර් මහතාගේ තර්කය වූයේ මෙය සැමියකු හා බිරිඳක අතර ඇතිවූ හුදු එකඟත්වයක් පමණක් බවත් එවන් එකඟතාවයන් සම්බන්ධයෙන් යෙදෙන පූර්ව නිගමනය වන්නේ පාර්ශවයන් අතර නෛතික බැඳීමක් ඇතිකර ගැනීමේ බරපතල චේතනාවක් නොමැතිය යන්න වන බවත්, ඒ අනුව මෙම එකඟතාවය නීතියට අනුව වලංගු ගිවිසුමක් නොවන බවයි.

එම තර්කය පිලිගත් අධිකරණය මෙහිදී අදාල පාර්ශවයන් අතර නෛතික බැඳීමක් ඇතිකර ගැනීමේ බරපතල චේතනාවක් ඔවුන්ගේ හැසිරීම අනුව පෙනෙන්නට නොතිබූ බැවින් නීතියට අනුව වලංගු ගිවිසුමක් නොමැති බවත් ඒ අනුව වන්දි ඉල්ලා සිටීමට බැල්ෆර් මහත්මියට නීත්‍යානුකූල අයිතියක් නොමැති බවයි.

**<u>මෙරිට් එරෙහිව මෙරිට්</u>**

විවාහක යුවලක් වූ මෙරිට් මහතා සහ මෙරිට් මහත්මිය එකිනෙකාගෙන් වෙන්ව ජීවත් වූ අතර දිනක් එම දෙදෙනා මුණ ගැසුණු අවස්ථාවේදී මෙරිට් මහතා විසින් මෙරිට් මහත්මියට පොරොන්දු වූයේ ඒ වන විටත් උකස් තබා ඇති වෛවාහක දේපලක් වන මෙරිට් මහත්මිය පදිංචි නිවස සඳහා උකස් වාරික වශයෙන් ගෙවීමට මාසික දීමනාවක් ඇය වෙත ගෙවන බවටත්, එම උකස සඳහා මුදල් ගෙවා එය සම්පූර්ණයෙන්ම නිදහස් කරගත් පසු එම දේපල බිරිඳගේ නමට පවරන බවත්ය. එහෙත් එම වදනින් පමණක් සෑහීමකට පත් නොවූ මෙරිට් මහත්මිය අදාල එකඟත්වය ලිඛිතව ලබා දෙන ලෙස ඉල්ලා සිටි බැවින් මෙරිට් මහතා එය ලිඛිතව ලබා දෙන ලදී.

එහෙත් උකස අවසානයේදී එය මෙරිට් මහත්මිය වෙත පැවරීම මෙරිට් මහතා විසින් පැහැර හැරි අතර ඊට එරෙහිව ගිවිසුම් කඩ කිරීම යටතේ පැවරූ මෙම නඩුවේදී මෙරිට් මහතාගේ තර්කය වූයේ මෙම එකඟතාවය සැමියෙකු හා බිරියක අතර ඇතිවූ හුදු එකඟතාවයක් පමණක් බවත්, එවන් ගිවිසුම් වලට අදාලව නෛතික බැඳීමක් ඇතිකර ගැනීමේ චේතනාවක් නොමැති බවට පූර්ව නිගමනයක් පවතින නිසා මෙය නීතියට අනුව වලංගු ගිවිසුමක් නොවන බවයි.

එම තර්කය ප්‍රතික්ෂේප කළ අධිකරණය මෙහිදී තීරණය කළේ මෙහි පාර්ශවයන්ගේ හැසිරීම අනුව ( අදාල එකඟත්වය ලිඛිතව ලබා දීම මත ) ඉහත පූර්ව නිගමනය මෙහිදී බිඳ හෙලී ඇති

බැවින් වලංගු ගිවිසුමක් සංස්ථාපනය වී ඇති බැවින් ඒ අනුව ක්‍රියා කිරීමට පාර්ශවයන්ට බැඳීමක් ඇති බවයි.

## කොන්දේසි සහ ප්‍රතිඥාහාර

ගිවිසුමක ඇති වගන්ති වැදගත්කම අනුව කොටස් දෙකකට බෙදේ. **සාපේක්ෂව වැදගත්කම වැඩි වගන්ති කොන්දේසි ලෙසත්, සාපේක්ෂව වැදගත්කම අඩු වගන්ති ප්‍රතිඥාහාර ලෙසත් හැඳින්වේ.**

ගිවිසුමක වගන්ති විවිධ සංඛ්‍යාවක් පැවතිය හැකිය. එම වගන්ති වලට ගිවිසුමක නියම / කරුණු / වගන්ති යන වචනද භාවිතා වේ. යම් කරුණක් කොන්දේසියක් ලෙස සැලකිය යුතු බවට එකී ගිවිසුම තුල සඳහන් වුවහොත් එය කොන්දේසියක් ලෙසද, යම් කරුණක් ප්‍රතිඥාහාරයක් ලෙස සැලකිය යුතු බවට එකී ගිවිසුම තුල සඳහන් වුවහොත් එය ප්‍රතිඥාහාරයක් ලෙසද සැලකිය යුතුය.

**✡✡ එහෙත් යම් කරුණක් කොන්දේසියක් ලෙස සැලකිය යුතුද එසේත් නැතිනම් ප්‍රතිඥාහාරයක් ලෙස සැලකිය යුතුද යන්න පිළිබඳව එකී ගිවිසුමෙහි සඳහන්ව නැතිනම්, එකී කරුණ සාපේක්ෂව වැදගත්කම වැඩි එකක් නම් කොන්දේසියක් ලෙසද, සාපේක්ෂව වැදගත්කම අඩු එකක් නම් ප්‍රතිඥාහාරයක් ලෙසද සැලකිය හැකිය. ✡✡**

### වොලිස් එරෙහිව ප්‍රැට්

**කොන්දේසියක් යන්න අර්ථ කථනය කළේ , ඉටු නොකළහොත් , ගිවිසුමට සම්බන්ධ අනෙක් පාර්ශවය විසින් ගිවිසුම ක්‍රියාත්මක කිරීමේදී ඇතිවූ සැලකිය යුතු පැහැර හැරීමක් ලෙස දකින, ගිවිසුමේ ස්වභාවය අනුව ඉතා අත්‍යවශ්‍ය , ගිවිසුමේ මූලික හරය වෙත දිවෙන බැඳීමක් ලෙසය.**

**මෙම නඩුවේදීම ප්‍රතිඥාහාරයක් යන්න අර්ථ කථනය කළේ , ඉටුකළ යුතු වුවත් , එසේ ඉටුකරනු නොලැබීම ගිවිසුමේ හරයට බලපෑමක් ඇතිනොකරන , අත්‍යවශ්‍ය නොවන බැඳීමක් ලෙසය.**

**කොන්දේසියක් කඩවීමකදී අහිංසක පාර්ශවයට ( ස්වකීය අභිමතය පරිදි ) ලබාගතහැකි සහන**

- ගිවිසුම අවසන් කිරීම
- ගිවිසුම ප්‍රකාර තම බැඳීම් ඉටුකිරීම ප්‍රතික්ෂේප කිරීම
- සිදුවූ හානි සඳහා වන්දි අයකර ගැනීම ( ගිවිසුම කඩ කළ පාර්ශවය වෙතින් )

❄❄ එහෙත් ගිවිසුමක **ප්‍රතිඥාහාරයක් කඩවූ විට අහිංසක පාර්ශවයට ලබාගත හැකි එකම සහනය වන්නේ අලාභ අය කර ගැනීම පමණි.** එනම්, ප්‍රතිඥාහාරයක් කඩවූ පමණින්ම ගිවිසුමක් අවසන් නොවේ. එවන් අවස්ථාවකදී ගිවිසුම තවදුරටත් වලංගුය. ❄❄

### ලොම්බාර්ඩ් නෝර්ත් සෙන්ට්‍රල් පී.එල්.සී. එරෙහිව බටර්ස්වර්ත්

පරීක්ෂනක කුලියට දීම සඳහා දෙපාර්ශවයක් අතර ඇතිවූ ගිවිසුමේ එක් වගන්තියක සඳහන් වූයේ වාරික ගෙවීම අප්‍රමාදව සිදුකිරීම ගිවිසුමේ සාරය වන බවයි. පරීක්ෂනක කුලියට ගත් අය එක් වාරිකයක් ගෙවීම පමා කළේය.

අධිකරණය මෙහිදී තීරණය කළේ "සාරය වන බවයි" යන වාක්‍ය ඛණ්ඩයේ අර්ථය වන්නේ එම වගන්තිය කොන්දේසියක් ලෙස සැලකීමට ගිවිසුමේ දෙපාර්ශවය විසින් එකඟ වූ ලෙස සැලකිය හැකි බවයි. ඒ අනුව එක් වාරිකයක් ගෙවීම පමා කිරීමේ හේතුව මත එම කුලී ගිවිසුම අවසන් කිරීමටත්, තමාට සිදුවී ඇති පාඩුවක් වෙතොත් ඒ සඳහා වන්දි අය කර ගැනීමටත් මෙහි අහිංසක පාර්ශවය වන පරීක්ෂනක කුලියට දුන් අයට අයිතියක් ඇති බවයි.

**<u>බිටිනි එරෙහිව ගයි</u>**

ප්‍රසිද්ධ ගායිකවක වූ බිටිනි, ප්‍රසංග සංවිධායකයකු වූ ගයි සමග ගිවිසුමකට එළඹුනේ නිශ්චිත කාල පරිච්ඡේදයකදී ප්‍රසංගයක් පැවැත්වීමටත්, ඊට සතියකට පෙර සිට එහි පෙරහුරු පැවැත්වීමටත්ය. එහෙත් බිටිනි එකී පෙරහුරු ගායනයන් සඳහා සහභාගී වූයේ ප්‍රසංගයට දින තුනකට පෙරදීය. තමා සහ බිටිනි අතර ඇතිවූ ගිවිසුම බිටිනි විසින් කඩ කළ බවට චෝදනා කරමින් ගයි විසින් එම ගිවිසුම අවසන් වූ ලෙස සැලකීය. මෙම තීරණයට විරුද්ධව බිටිනි විසින් පැවරූ මෙම නඩුවේදී අධිකරණය තීරණය කළේ මෙහිදී වඩා වැදගත් කාරණාව වන්නේ ප්‍රසංගය මිස පෙරහුරු ගායනය නොවන බවත්, ඒ අනුව බිටිනි විසින් කඩ කර ඇත්තේ සාපේක්ෂව වැදගත්කම අඩු දෙයක් ( එනම්, ප්‍රතිඥාභාරයක් ) පමණක් බවත්, ඒ අනුව අහිංසක පාර්ශවය වන ගයි ට ඇති එකම සහනය වන්නේ ( බිටිනිගේ නොපැමිණීම නිසා තමාට නිකරුණේ දින තුනක් දරන්නට සිදුවූ විය පැහැදම් , උදා - ශාලා කුලී, ප්‍රවාහන වියදම්, සේවක කුලී, ආදිය සඳහා ) වන්දි අය කර ගැනීමේ අයිතිය පමණක් බවත්ය.

**<u>පූසාඩ් එ. ස්පියර්ස්</u>** නඩුවේදී අධිකරණය තීරණය කළේ නාට්‍යයක ප්‍රධාන චරිතයක් රඟපෑම සඳහා එහි නිෂ්පාදකවරුන් සමග ගිවිසුමකට එළඹි නිලියකට "සතියක කාලයක් එම චරිතය රඟපෑමට අපොහොසත් වීම" යන කාරණාව, අදාල අවස්ථානුගත කරුණු අනුව කොන්දේසි කඩ කිරීමකට සමාන බවයි.

## <u>වගකීම නිදහස් කිරීමේ වගන්ති</u>

තමා විසින් එලඹි ගිවිසුමට අදාලව සමහර කාරණා සම්බන්ධයෙන් තමා වගනොකියන බවට පවසමින් ගිවිසුමට සම්බන්ධ යම් පාර්ශවයක් විසින් එකී ගිවිසුමට එක් කරනු ලබන වගන්ති මෙනමින් හැඳින්වේ.

වගකීම නිදහස් කිරීමේ වගන්ති සම්බන්ධයෙන් පහත රීතීන් අදාල වේ.

1. ගිවිසුමක මූලික වගකීම බැහැර වන ආකාරයේ වගකීම නිදහස් කිරීමේ වගන්ති වලංගු නැත.

2. වගකීමෙන් නිදහස් කිරීමේ වගන්තිය ගිවිසුමේ අනෙක් පාර්ශවයට සන්නිවේදනය කිරීම හෝ ගිවිසුමට ඇතුලු කිරීම , ගිවිසුම ආරම්භ කිරීමට පෙර සිදු කළ යුතුය.

**<u>ඔලී එ. මාල්බාරෝ කෝට්</u>** - එකතරා යුවලක් හෝටලයක් වෙත ගොස් එහි කාමරයක් කුලියට ගෙන එම කාමරය තුලට ගිය විට දැකගැනීමට හැකි වූයේ "ඔබගේ වටිනා භාණ්ඩ නැතිවීම සම්බන්ධයෙන් හෝටල් කළමණාකාරීත්වය වග කියනු නොලැබේ" යනුවෙන් වූ වගකීම නිදහස් කිරීමේ වගන්තියක් සහිත දැන්වීමකි. ඔවුන් දෙදෙනා මද වේලාවකට කාමරයෙන් එළියට පැමිණ

නැවත එය තුළට ගිය විට දැකගත හැකි වූයේ ඔවුන්ගේ වටිනා බඩු බාහිරාදිය යමෙකු විසින් සොරාගෙන ඇති බවයි. හෝටලය වෙතින් අදාල අලාභය ඉල්ලා සිටි නමුත් හෝටල් සමාගම විසින් ප්‍රකාශ කර සිටියේ එම දැන්වීම ප්‍රකාරව තමන් මේ සම්බන්ධව වගකිව යුතු නොමැති බවයි. නමුත් අධිකරණය මෙහිදී ප්‍රකාශ කර සිටියේ මෙහිදී මෙම හෝටල් කාමරය කුලියට ගැනීමේ ගිවිසුම ඇති වන්නේ හෝටලයේ පිළිගැනීමේ කවුන්ටරය අසලදී වන නිසා මෙම වගකීම නිදහස් කිරීමේ වගන්තියක් සහිත දැන්වීම එම යුවලට දර්ශනය වූයේ ගිවිසුමට එළඹි පසුව වන බැවින් එය වලංගු වගකීම නිදහස් කිරීමේ වගන්තියක් නොවන බවයි.

3. බිල්පතක්,ටිකට් පතක් වැනි අත්සන් නොකළ ලේඛණයක වගකීමෙන් නිදහස් කිරීමේ වගන්තියක් ඇතුලත්ව ඇත්නම්, එම වගන්තිය පැහැදිලිව දර්ශනය විය යුතුය.

<u>**චැපල්ටන් එ. බැරී යූ.ඩී.සී**</u> - මෙහිදී එක්තරා ආයතනයක් වෙතින් පුටු කුලියට ගැනීමට අයෙකු විසින් ගිවිසුමකට එළඹි අතර ඒ වෙනුවෙන් නිකුත් කළ ටිකට් පතෙහි පිටුපස අපැහැදිලි ලෙස කුඩා අකුරෙන් සඳහන් වූයේ එම පුටු භාවිතා කිරීමේදී ඒවායේ යම් දුර්වලතාවයක් නිසා කිසිවෙකුට හෝ හානි සිදු වුවහොත් ඒ පිළිබඳව එම හිමිකාර ආයතනය වග නොකියන බවයි. මේ අතර එම පුටුවක් කඩා වැටීමෙන් එය භාවිතා කළ අයෙකුට හානි සිදුවූ අතර පුටු හිමිකාර ආයතනය ප්‍රකාශ කළේ ටිකට් පතෙහි සඳහන් වගකීමෙන් නිදහස් වීමේ වගන්තිය ප්‍රකාරව තමන්ට ඒ පිළිබඳව වගකීමක් නොමැති බවයි. නමුත් අධිකරණය මෙහිදී ප්‍රකාශ කළේ බිල්පතක්,ටිකට් පතක් වැනි අත්සන් නොකළ ලේඛණයක වගකීමෙන් නිදහස් කිරීමේ වගන්තියක් ඇතුලත්ව ඇත්නම්, එය වලංගු වීම සඳහා එම වගන්තිය පැහැදිලිව දර්ශනය විය යුතු නමුත් මෙහිදී එසේ නොවූ බැවින් එම වගකීමෙන් නිදහස් කිරීමේ වගන්තියේ ආරක්ෂාව මෙම ආයතනයට නොමැති බවයි. එනම් , එම ආයතනය අදාල වන්දි මුදල ගෙවිය යුතු බවයි.

4. වැරදි අර්ථ නිරූපනයක් මත පදනම් වන වගකීමෙන් නිදහස් කිරීමේ වගන්ති වලංගු නොවේ.

<u>**කර්ටිස් එ. කෙමිකල් ක්ලීනිං ඇන්ඩ් ඩයිං කම්පනි**</u> නඩුවේදී , පිරිසිදු කිරීම සඳහා ඇඳුම් තොගයක් ලොන්ඩරියක් වෙත භාරදුන් පසු එය භාරගෙන එම ලොන්ඩරිය විසින් නිකුත් කරන ලද, පාර්ශවයන් විසින් අත්සන් කල කුවිතාන්සියක සඳහන් වූයේ, “ඇඳුම් සේදීමේදී ඒවාට සිදුවන හානි සඳහා අදාල ලොන්ඩරි ආයතනය වග කියනු නොලැබේ” යනුවෙනි. මෙහි අර්ථය විමසූ විට එහි සේවකයෙකු ප්‍රකාශ කලේ “සේදීමට භාරගන්නා ඇඳුම්වල ඇති පබලු හා ස්ට්කින්ස් වලට සේදීමේදී සිදුවන හානිය සම්බන්ධයෙන් තම ආයතනය වග නොකියන බව” එම වගන්තියේ අර්ථය වනබවයි. එහෙත් එම රෙදි තොගය පිරිසිදු කිරීමේදී ලොන්ඩරි සේවකයන් විසින් රසායන ද්‍රව්‍ය අධික ප්‍රමාණ වලින් යෙදීම මත එම රෙදි වලට හානිවී තිබුණි. අධිකරණය මෙහිදී තීරණය කලේ එම ආකාරයේ වගකීමෙන් නිදහස් කිරීමේ වගන්තියේ ආරක්ෂාව ලොන්ඩරි ආයතනයට නොලැබෙන බවයි.

5. අසාධාරණ ගිවිසුම් නියම පනත ප්‍රකාරව පහත ආකාරයේ වගකීමෙන් නිදහස් කිරීමේ වගන්ති වලංගු නොවේ.

☛ නොසැලකිලිමත්කමේ ප්‍රතිපලයක් ලෙස ඇතිවන මරණයක් හෝ පුද්ගල හිංසනයක් සඳහා වන වගකීම බැහැර කිරීම

☛ ගිවිසුම යටතේ සාධාරණව අපේක්ෂා කළ කාර්යයට වඩා සැලකිය යුතු ලෙස වෙනස් වූ ගිවිසුමක් ඉටුකිරීම.

☛ භාණ්ඩ විකිණීමේ ආඥාපනත යටතේ ඇතිවන භාණ්ඩ විකිණීමේ ගිවිසුමක සමහර වගන්තීන්, වගකීමෙන් නිදහස් කිරීමේ වගන්ති මගින් බැහැර කළ නොහැක.

☛ පාරිභෝගික ණය පනත යටතේ ඇතිවන ගිවිසුමක සමහර වගන්තීන්, වගකීමෙන් නිදහස් කිරීමේ වගන්ති මගින් බැහැර කළ නොහැක.

☛ ගිවිසුමක පාර්ශවකරුවෙකුට වෙනත් ගිවිසුමක් යටතේ හිමිවන අයිතිවාසිකම් සහ අසාධාරණ ගිවිසුම් නියම පනතින් ඉවත් කිරීම තහනම් කල වෙනත් කෙනෙකුගේ වගකීම් ඉටුකිරීම, වගකීමෙන් නිදහස් කිරීමේ වගන්ති මගින් බැහැර කළ නොහැක.

---

## ගිවිසුම් ආකෘතිය

සාමාන්‍යයෙන් ලිඛිත, වාචික සහ ව්‍යංග යන ක්‍රම තුනටම වලංගු ලෙස ගිවිසුමක් ඇතිවිය හැකි වුවත් සමහර ගිවිසුම් සඳහා ව්‍යවස්ථාපිත නීතිය මගින් විවිධ සීමාකිරීම් පනවා ඇත.

උදාහරණ -

# වංචා වැලැක්වීමේ ආඥා පනතේ 2 වගන්තිය ප්‍රකාරව නිශ්චල දේපල සම්බන්ධ ගිවිසුමක් වලංගු වීමට නම්, ලිඛිතව ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු සහ සාක්ෂිකරුවන් දෙදෙනෙකු ඉදිරියේ අත්සන් කොට ඒ බව නොතාරිස් විසින් සහතික කොට තිබිය යුතුය.

# වංචා වැලැක්වීමේ ආඥා පනතේ 18 වගන්තිය ප්‍රකාරව ඇප බැඳුම්කර සහ චංචල දේපල උකස් කරන ගිවිසුම් ලිඛිතව මෙන්ම, වගකීම භාර ගන්නා තැනැත්තා විසින් අත්සන් කොට තිබිය යුතුය.

# වංචා වැලැක්වීමේ ආඥා පනත ප්‍රකාරව ආරම්භක ප්‍රාග්ධනය රුපියල් දහස ( 1000/-) ඉක්මවන හවුල් ව්‍යාපාර ගිවිසුමක් ලිඛිතව පැවතිය යුතුය.

---

## පාර්ශව වල අව්‍යාජ සහමතිය ( නියම කැමැත්ත )

නීතියට අනුව වලංගු ගිවිසුමක් ඇතිවීම සඳහා ඊට සම්බන්ධ පාර්ශවයන්ට එකී ගිවිසුමට එළඹීම පිලිබඳව නියම කැමැත්තක් හෙවත් අව්‍යාජ සහමතියක් තිබිය යුතුය. පහත අවස්ථා වලදී අදාල පාර්ශවයන්ට ගිවිසුමට එළඹීම සඳහා නියම කැමැත්තක් හෙවත් අව්‍යාජ සහමතියක් නොමැති සේ සැලකේ. එනම් එම අවස්ථා වලදී පාර්ශවයන් විසින් එළඹෙන ගිවිසුම වලංගු ගිවිසුමක් නොවනු ඇත.

- ගිවිසුමට සම්බන්ධ පාර්ශවයන් ''**වැරදීම**'' යටතේ කටයුතු කරන විට
- අවනිදේශනයක් හෙවත් කරුණු වරදවා දැක්වීමක් ඇතිවිට
- ගිවිසුමට සම්බන්ධ පාර්ශවයක් මත අයුතු බලපෑමක් ඇතිවිට
- ගිවිසුමට සම්බන්ධ පාර්ශවයක් මත සංත්‍රාසනයක් හෝ තර්ජනයක් ඇතිවිට
- අසාධාරණ මිලයේ පාඩුව නැමැති සංකල්පය යටතේ ක්‍රියා කර ඇති විට

### වැරදීම

මෙය කොටස් කිහිපයක් යටතේ අධ්‍යයනය කෙරේ.

1) ගිවිසුමක ස්වභාවය පිලිබඳව සිදුවන වැරදීම

**ෆොස්ටර් එරෙහිව මැකිනන්**

ඇස් පෙනීම දුර්වල මහලු පුද්ගලයෙක් ඇප පත්‍රයකැයි සිතා විනිමය බිලක් පිටසන් කල අතර එහිදී ඔහු අතින් කිසිඳු නොසැලකිල්ලක් නොවිය. එනම් ඔහු මෙම ගිවිසුමට එලඹියේ එහි ස්වභාවය පිලිබඳව සිදුවූ වැරදීමක් මතය. ඒ අනුව අදාල ගිවිසුම බලරහිත වන බවත් එම මහලු පුද්ගලයා එකී ගිවිසුමෙන් නොබැඳෙන බවත් තීරණය විය.

2) විෂය කරුණෙහි පැවැත්ම පිළිබඳව සිදුවන පොදු වැරදීම

මෙහිදී සිදුවන්නේ නොපවතින විෂය වස්තුවක් පවතින බවට විශ්වාස කොට දෙපාර්ශවයක් විසින් ගිවිසුමකට එලඹීමයි. එවන් ගිවිසුමක් වලංගු නැත.

**ස්කොට් එ. කොල්සන්** - සී ගේ ජීවිත රක්ෂණය බී ට පැවරීම සඳහා ඒ සහ බී අතර ගිවිසුමක් ඇතිවුණි. එහෙත් එම දෙදෙනා නොදැනුවත්වම, එම ගිවිසුමට එළඹෙන මොහොත වන විට සී මියගොස් තිබුණි.( එනම් දෙදෙනා ගිවිසුමට එළඹෙන මොහොත වන විට එහි විෂය වස්තුව වන ජීවිත රක්ෂණය වලංගු නැත.) අධිකරණය මෙහිදී තීරණය කළේ විෂය වස්තුවේ පැවැත්ම පිළිබඳව පොදු වැරදීමක් සිදුවී ඇති බැවින් මෙම ගිවිසුම වලංගු එකක් නොවන බවයි.

3) විෂය වස්තුවේ අනන්‍යතාවය පිලිබඳව සිදුවන අනයෝන්‍ය වැරදීම

මෙහිදී සිදුවන්නේ ගිවිසුමට සම්බන්ධ පාර්ශවයන්ට ඊට අදාල විෂය වස්තුව සම්බන්ධයෙන් අනයෝන්‍ය වශයෙන් වැරදීමක් සිදු වීමයි. ඒ අනුව එකම විෂය වස්තුවක් සම්බන්ධයෙන් අර්පනයක් සහ ප්‍රතිග්‍රහණයක් ගිවිසුමට සම්බන්ධ පාර්ශවයන්ට නොමැති බැවින් ගිවිසුම වලංගු එකක් නොවේ.

**Raffles Vs Wichelhaus** - බොම්බියේ සිට පිටත් වන X නැමැති නැවෙන් රැගෙන එන කපු තොගයක් මිලදී ගැනීම සඳහා දෙදෙනෙකු ගිවිසුමකට එළඹි අතර X නමින් බොම්බායෙන් පිටත් වන නැව් දෙකක් පැවතුණි. ඉන් එක් නැවක් බොම්බායේ සිට ඔක්තෝම්බර් මාසයේදීද, අනෙක් නැව බොම්බායේ සිට දෙසැම්බර් මාසයේදීද පිටත් වීමට නියමිතව තිබුණි. ගැනුම්කරු අදහස් කළේ ඔක්තෝබර් මාසයේ පිටත් වන නැව වූ අතර විකුණුම්කරු අදහස් කළේ දෙසැම්බර් මාසයේ පිටත් වන නැවයි. අධිකරණය මෙහිදී තීරණය කළේ විෂය වස්තුවේ අනන්‍යතාවය සම්බන්ධව අනෝන්‍ය වැරදීමක් සිදුවී ඇති බැවින් මෙහිදී වලංගු ගිවිසුමක් ඇතිවී නොමැති බවයි.( එකම විෂය වස්තුවක් සම්බන්ධයෙන් අර්පනයක් සහ ප්‍රතිග්‍රහණයක් සමපාතව නැති නිසා )

4) පාර්ශවයන්ගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් ඇතිවන ඒකපාර්ශවික වැරදීම

මෙහිදී සිදුවන්නේ ගිවිසුමට සම්බන්ධ එක් පාර්ශවයක් වංචනිකව ව්‍යාජ පුද්ගලයෙකු ලෙස පෙනී සිටියදී අනෙක් පාර්ශවය විසින් එම වංචනික ගිවිසුම් සහකරුගේ සැබෑ අනන්‍යතාවය පිලිබඳව රැවටීමකට ලක්වෙමින් ගිවිසුමට එලඹීමයි. මෙහිදී වැරදීමකට ලක් වන්නේ එක් පාර්ශවයක් පමණක් බැවින් මෙය පාර්ශවයන්ගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් ඇතිවන ඒකපාර්ශවික වැරදීමකි.

මෙහිදී අදාලවන නෛතික තත්වය වන්නේ පාර්ශවකරුවකුගේ අනන්‍යතාවය ගිවිසුමට බලපාන කරුණක් වන්නේ නම්, එවැනි ගිවිසුමක් අවලංගු ගිවිසුමක් වන බවයි. ( මෙහිදී අදාල පාර්ශවයන්ගේ චේතනාව ඉතා වැදගත්ය. එනම්, තමා යම් නිශ්චිත පුද්ගලයෙකු සමග පමණක්

ගිවිසුම් ගත වීමට අපේක්ෂා කලාද, එසේත් නැතිනම් තමා වෙත ගිවිසුමට එලඹීමට ඉදිරිපත් වන ඕනෑම පුද්ගලයෙක- සමග ගිවිසුම් ගත වීමට අදහස් කලාද යන කාරණාව ඉතා වැදගත්ය. )

**<u>කුන්ඩි එරෙහිව ලින්ඩ්සේ</u>**

ප්‍රසිද්ධ ආයතනයක අත්සන් සහ නිලමුද්‍රා ව්‍යාජ ලෙස භාවිතා කල එක්තරා වංචනික පුද්ගලයෙකු , තමා වෙත භාණ්ඩ සැපයීම සඳහා X නැමැත්තෙක්ව පොලඹවා ගත්තේය.මෙහිදී X නැමැත්තා එම වංචනික පුද්ගලයා සමග ගිවිසුමට එලඹුණේ තමා අදාල ප්‍රසිද්ධ ආයතනය සමග ගිවිසුමට එලඹෙන බව මුලුමනින්ම විශ්වාස කරමිනි. අධිකරණය මෙහිදී තීරණය කලේ එම වංචනික පුද්ගලයා සමග ගිවිසුමකට එලඹීමට X නැමැත්තා කෙදිනකවත් අදහස් නොකල බැවින් ................................................

..........................................................................................................................................................
..........

## <u>ගිවිසුමක් අවලංගු නොකරන මට්ටමේ වැරදි</u>

- ගිවිස ගන්නා අයිතමයේ ගුණාත්මක භාවය සම්බන්ධ වැරදි
- විනිශ්චය පිළිබඳ වැරදීම
- වෙළඳ විස්තරයක් අනුව භාණ්ඩ විකුණන විට වෙළඳ විස්තරයෙහි අර්ථය සම්බන්ධයෙන් වන වැරදි
- ගිවිසුමක් ඉටුකිරීමට ගතවන වේලාව පිළිබඳව ඇති වන වැරැද්ද

## <u>අවනිදේශනය / කරුණු වරදවා දැක්වීම</u>

අවනිදේශනයක් යනු කරුණු වරදවා දැක්වීමකි.

අවනිදේශනයක් මත ගිවිසුමක් අවලංගු කර ගැනීම සඳහා පහත කරුණු තෘප්ත විය යුතුය.

1. ගිවිසුමේ වැදගත් කරුණක් පිළිබඳව අවනිදේශනයක් තිබිය යුතුය.

2. එම අවනිදේශනය ගිවිසුමේ අනෙක් පාර්ශවය විසින් සිදු කළ යුතුය.

3. ගිවිසුමට එළඹීමට පෙර එම අවනිදේශනය සිදුකර තිබිය යුතුය.

4. අනෙක් පාර්ශවයව ගිවිසුමට එළඹීමට පොළඹවා ගැනීමේ අදහසින් එම අවනිදේශනය සිදුකර තිබිය යුතුය.

5. එම අවනිදේශනය මත පදනම්ව අනෙක් පාර්ශවය ගිවිසුමට එළඹ තිබුණා විය යුතුය.

මෙය කොටස් තුනකට බෙදේ.

1) අහිංසක අවනිදේශනය / නිර්දෝෂී අවනිදේශනය

ගිවිසුමට සම්බන්ධ යම් පාර්ශවයක් විසින් අවංකවම සත්‍යයක් ලෙස විශ්වාස කරමින් සිදුකරන කරුණු දැක්වීමක් අසත්‍ය කරුණු දැක්වීමක් වන අවස්ථාවකදී එය අහිංසක අවනිදේශනයක් ලෙස හැඳින්වේ.

2) නොසැලකිලිමත් අවනිදේශනය

ගිවිසුමට සම්බන්ධ යම් පාර්ශවයක් විසින් නොසැලකිලිමත්භාවයකින් යුතුව සිදුකරන කරුණු දැක්වීමක් නොසැලකිලිමත් අවනිදේශනයක් ලෙස හැඳින්වේ.

3) වංචනික අවනිදේශනය

ගිවිසුමට සම්බන්ධ යම් පාර්ශවයක් විසින් වංචනික චේතනාවකින් යුතුව සිදුකරන කරුණු දැක්වීමක් වංචනික අවනිදේශනයක් ලෙස හැඳින්වේ.

අහිංසක / නිර්දෝශී අවනිදේශනයක් මත යමෙකු ගිවිසුමකට එළඹ ඇත්නම්, එම පාර්ශවයට ( අහිංසක පාර්ශවයට ) ස්වකීය අභිමතය මත ගිවිසුම අවලංගු කිරීම හෝ ගිවිසුම අනුමත කිරීම කළ හැකිය. නොසැලකිලිමත් හෝ වංචනික අවනිදේශනයකදී ඉහත අයිතීන් දෙකට අමතරව ගිවිසුම ඉටුකිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ හානි සඳහා වන්දි ඉල්ලීමේ අයිතිය ගිවිසුමේ අහිංසක පාර්ශවයට ඇත.

## අයුතු බලපෑම

නියම අයුතු බලපෑම සහ පූර්වානුමාන අයුතු බලපෑම ලෙස අයුතු බලපෑම කොටස් දෙකකට බෙදේ.

1) නියම අයුතු බලපෑම

තමා සමග ගිවිසුමකට එලඹෙන ලෙස ගිවිසුමට සම්බන්ධ එක් පාර්ශවයක් විසින් අනෙක් පාර්ශවය වෙත සත්‍ය වශයෙන්ම අයුතු බලපෑමක් සිදු කිරීම මෙයින් අදහස් වේ. මෙහිදී අයුතු බලපෑමට යටත් වූ පාර්ශවයට අදාල ගිවිසුමට එලඹීම සඳහා නියම කැමැත්තක් නොමැති බැවින් අදාල ගිවිසුම නිර්දෝෂි පාර්ශවයේ අභිමතය මත අවලංගු කල හැකිය.

**බෑන්ක් ඔෆ් ක්‍රෙඩිට් ඇන්ඩ් කොමර්ස් එ. අබුඩි** - හවුල් අයිතිය තිබූ දේපලක් උකස් කිරීම සඳහා වූ ගිවිසුමකට අත්සන් කරන ලෙස ස්වාමි පුරුෂයා විසින් තම භාර්යාවට අයුතු බලපෑමක් කරයි. අධිකරණය තීරණය කළේ භාර්යාව විසින් මෙම උකස් ගිවිසුමට එළඹුණේ අයුතු බලපෑමක් යටතේ වන බැවින් එම ගිවිසුම වලංගු එකක් නොවන බවයි.

2) පූර්වානුමාන අයුතු බලපෑම

ගිවිසුමට සම්බන්ධ පාර්ශවයන්ගේ තරාතිරම, ඔවුන් එකිනෙකාට දක්වන සම්බන්ධතාවය ආදී කරුණු මත සත්‍ය වශයෙන්ම අයුතු බලපෑමක් නොකලද, අයුතු බලපෑමක් සිදු විය හැකි බවට අනුමාන කල හැකි අවස්ථා ඇත. එවන් අවස්ථා වලදීද අදාල පූර්වානුමාන අයුතු බලපෑමට යටත් වූ පාර්ශවයට අදාල ගිවිසුමට එලඹීම සඳහා නියම කැමැත්තක් නොමැති බැවින් අදාල ගිවිසුම නිර්දෝෂි පාර්ශවයේ අභිමතය මත අවලංගු කල හැකිය. එලෙස පූර්වානුමාන අයුතු බලපෑමක් කල හැකි පාර්ශවයන් පහත පරිදි වේ.

- වෛද්‍යවරයාට ➩➩➩ තම රෝගියා කෙරෙහි
- නීතීඥවරයාට ➩➩➩ තම සේවාදායකයා කෙරෙහි
- ආගමික නායකයන්ට / උපදේශකයන්ට ➩➩ තම අනුගාමිකයන් කෙරෙහි
- ගුරුවරුන්ට ➩➩➩ තම ශිෂ්‍යයන් කෙරෙහි

👍 දෙමාපියන්ට ➪➪➪ තම දරුවන් කෙරෙහි

**<u>තර්ජනය හෝ තර්ජනය</u>**

තර්ජනය හෝ සංත්‍රාසනය යනුවෙන් අදහස් වන්නේ ගිවිසුමේ එක් පාර්ශවයක් විසින් අනෙක් පාර්ශවය වෙත සිදු කරනු ලබන සත්‍ය වශයෙන්ම ප්‍රචණ්ඩත්වය මුදාහැරීමක් හෝ ප්‍රචණ්ඩත්වය මුදාහැරීමක් පිලිබඳව කරනු ලබන තර්ජනයකි.

**<u>විවිධ සංත්‍රාසන වර්ග</u>**

1) සැබෑ ලෙස තර්ජනාත්මකව සිදු කරනු ලබන ශාරීරික ප්‍රචණ්ඩත්වය හෝ සිරකිරීම.

උදා - පහරදීම, පහරදෙන බවට තර්ජනය කිරීම, පැහැරගැනීම, පැහැරගන්නා බවට තර්ජනය කිරීම

2) දේපල පරිග්‍රහණය කරන බවට ( බලහත්කාරයෙන් අත්පත් කරගන්නා බවට ) කරන තර්ජනය

**<u>මැස්කෙල් එරෙහිව හෝර්න්</u>**

වෙලඳසැලක හිමිකරුවෙකු විසින් එහි වෙලෙන්දෙකුගෙන් බද්දක් ඉල්ලා සිටි අතර වෙලෙන්දා එය ගෙවීම ප්‍රතික්ෂේප කල විට හිමිකරු විසින් වෙලෙන්දාගේ සමහර භාණ්ඩ බලහත්කාරයෙන් අත්පත් කරගත්තේය. ඉන්පසුව එම වෙලෙන්දා එම බද්ද ගෙවූ අතර ( එනම්, හිමිකරු සමග බදු ගිවිසුමකට එලඹී අතර ) , හිමිකරු විසින් තමාගේ භාණ්ඩ ඉදිරියේදීත් බලහත්කාරයෙන් අත්පත් කරගනිතැයි යන බියෙන් දිගින් දිගටම එම බදු මුදල ගෙවාගෙන ගියේය. අධිකරණය මෙහිදී තීරණය කලේ වෙලෙන්දා විසින් මෙම බදු ගිවිසුමට එලඹියේ දේපල පරිග්‍රහණය පිලිබඳව වූ තර්ජනයක් මත වන බැවින් මෙම බදු ගිවිසුම හිස් කල හැකි ( අවලංගු කල හැකි ) ගිවිසුමක් වන බවත්, අදාල බද්ද යටතේ ගෙවන ලද මුදල් වෙලෙන්දාට හිමිකරුගෙන් ආපසු අයකර ගතහැකි බවත්ය.

3) නඩු කියන ( පවරන ) බවට තර්ජනය

**<u>කවුග්මන් එරෙහිව ගර්සන්</u>**

G සහ K අතර ඇතිකරගත් ගිවිසුමක් සඳහා K විසින් G ගේ කැමැත්ත ලබාගත්තේ, තමා සමග මෙම ගිවිසුමට එලඹුනේ නැතිනම් G ගේ ස්වාමිපුරුෂයා විසින් මින් පෙර සිදු කරන ලද අපරාධයක් පිලිබඳව ඔහුට විරුද්ධව නඩු පවරන බවට තර්ජනය කරමිනි.

මෙම ගිවිසුම අවලංගු කල හැකි බව අධිකරණය තීරණය කලේය.

4) ආර්ථික සංත්‍රාසනය / ආර්ථික තර්ජනය

මින් අදහස් වන්නේ පුද්ගලයෙකුගේ දේපල වලට සහ / හෝ මූල්‍ය හිමිකම් වලට එල්ලකරන නීතිවිරෝධී පීඩනයක් හෝ අනීතික බලපෑමකි.

**<u>ඩී ඇන්ඩ් සී බිල්ඩර්ස් ලිමිටඩ් එ. රීස්</u>** - ණය හිමියාට අය විය යුතු ණය මුදල සම්පූර්ණයෙන් බේරුම් කිරීමක් ලෙස සුලු මුදලක් පිලිගැනීමට ණය හිමියා තමන් සමග ගිවිසුමකට එළඹෙන්නේ නැතිනම්, ඔහුට කිසිඳු මුදලක් නොගෙවන බවට ණයගැතියා විසින් කරනු ලැබූ තර්ජනය , ණය හිමියා මත නීති විරෝධී පීඩනයක් ඇතිකළ එකක් බැවින් ආර්ථික තර්ජනයක් වන බවත්, අදාල ගිවිසුම අවලංගු එකක් බවත් තීරණය විය.

## අසාධාරණ මිලයේ පාඩුව ( Laesio Enormis )

**Laesio Enormis** යන යෙදුමෙහි සිංහල භාෂා අර්තය වන්නේ බලවත් අගතිය හෝ බලවත් පාඩුව යන්නයි.

පහත උදාහරණය සලකන්න.

X විසින් තම ඉඩම Y වෙත රු.මිලියනයකට විකුණයි. එහි සැබෑ වෙළඳපොල වටිනාකම රු. මිලියන 10 ක් බවත් රු.මිලියනයකට එය විකිණීමෙන් තමාට වරදක් සිදුවු බවත් X විසින් පසුව අවබෝධ කරගනී. ඒ අනුව අසාධාරණ මිලයේ පාඩුව වශයෙන් X රු. මිලියන 9 ක් පාඩු විඳ ඇත.

අසාධාරණ මිලයේ පාඩුව මත අධිකරණයෙන් සහන ඉල්ලීමේ අයිතියක් X ට ඇත.( ගිවිසුම අවසන් කිරීම හෝ විකුණුම් මිල ආපසු ගෙවීම වැනි සහනයක්.)

## පාර්ශව වල ශක්‍යතාවය / ශක්නුතාවය / පාර්ශවයන්ට ගිවිසුම් වලට එලඹීමට ඇති හැකියාව

ගිවිසුමක් යනු නෛතික බැඳීමකි. ගිවිසුමට සම්බන්ධ පාර්ශවයන්ට එම ගිවිසුම ස්වභාවය අවබෝධ කරගැනීමේ මානසික හැකියාවක් සහ එය ඉටුකිරීමේ හැකියාවක් තිබිය යුතුය. ඒ අනුව සමහර පුද්ගල කොට්ඨාභයන්ට ගිවිසුම් වලට එලඹීමේ හැකියාව නොමැති ලෙස නීතිය සලකයි.එවන් පාර්ශවයන් පහත පරිදි වේ.

1) බාලවයස්කරුවන්

වයස අවුරුදු 18 ට වඩා අඩු අය බාලවයස්කරුවන් ලෙස සැලකේ. ඔවුන්ට ගිවිසුම් ශක්නුතාවයක් / ගිවිසුම් ශක්‍යතාවයක් නොමැති ලෙස සැලකේ. සාමාන්‍ය රීතිය නම් බාලවයස්කරුවන් විසින් එලඹෙන ගිවිසුම් වලංගු නොවන බවයි.

එහෙත් එම රීතියට ව්‍යතිරේඛ ඇත. ඒවා පහත පරිදිය. ඒ අනුව පහත අවස්ථා වලදී බාලවයස්කරුවන් විසින් එලඹෙන ගිවිසුම් වලංගු ගිවිසුම් ලෙස නීතිය විසින් සලකනු ලබන අතර ඒ අවස්ථා වලදී දෙපාර්ශවයම ( බාලවයස්කරුද ඇතුලුව ) එවන් ගිවිසුම් වලින් බැඳෙති.

I)බාලවයස්කරුවෙකු විසින් එලඹෙන ඔහුට අත්‍යාවශය භාණ්ඩ මිලදී ගැනීමේ ගිවිසුමක්

**නෑෂ් එරෙහිව ඉන්මාන්**

බාලවයස්කරුවෙකු වූ ඉන්මාන්, නෑෂ් ගෙන් ණය පදනම මත යටකබා 11 ක් මිලදී ගත්තේය. එහෙත් ඒ වන විටත් ඉන්මාන් සතුව ඕනෑ තරම් යටකබා තිබුණි. ඒ අනුව බාලවයස්කරු විසින් එලඹි මෙම ගිවිසුම බාලවයස්කරුට අත්‍යාවශ්‍ය භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් නොවන බැවින් ..............................................

....................................................................................................................................................

....................................................................................................................................................

✡✡✡ ඒ අනුව බාලවයස්කරුවෙකු සමග ගිවිසුමකට එලඹෙන පුද්ගලයෙකු, අදාල ගිවිසුම බාලවයස්කරුට අත්‍යාවශ්‍ය එකක් වන්නේද? යන කාරණාව පිලිබඳව සැලකිලිමත් විය යුතුය.

II)බාලවයස්කරුට වාසිදායක වන අන්දමේ අධ්‍යාපනික,රැකියා සහ ආධුනිකත්ව ගිවිසුම්

**<u>නීතිපති   එරෙහිව කොස්තා</u>**

……………………………………………………………………………………………………………………………
……….

……………………………………………………………………………………………………………………………
……….

……………………………………………………………………………………………………………………………
……….

……………………………………………………………………………………………………………………………
……….

……………………………………………………………………………………………………………………………
……….

……………………………………………………………………………………………………………………………
……….

……………………………………………………………………………………………………………………………
……….

III)බැංකු ගිණුම්

බැංකු ගිණුමක් යනු එක්තරා ආකාරයකට බැංකුව සහ ගිණුම් හිමියෙකු අතර ඇතිවන ගිවිසුමකි. බාලවයස්කරුවෙකුට අයිරාවක් නොවන බැංකු ගිණුමක් පවත්වා ගෙන යා හැකිය.

**<u>බාලවයස්කරුවෙකු විසින් එලඹ ඇති ගිවිසුම් අනුමත කිරීම</u>**

බාලවයස්කරුවෙකු වැඩිහිටි වියට පත්වූවාට පසුව, තමා බාලවයස්කරුවෙකුව සිටියදී තමා විසින් එලඹි ගිවිසුමක් ප්‍රකාශිතව හෝ ව්‍යංගයෙන් වුවද අනුමත කල හැකිය. එවිට එවන් ගිවිසුමක් ඇතිකර ගත් දිනයේ සිටම බලාත්මක වේ.

2) මානසික උමතු පුද්ගලයින්

ගිවිසුමකට එලඹෙන අවස්ථාවේදී එම ගිවිසුමට සම්බන්ධ යම් පාර්ශවයක් උමතුව සිටියේ නම් ඒ අවස්ථාවේදී තමා විසින් එලඹෙන ගිවිසුමේ ස්වභාවය සහ ප්‍රතිපලය අවබෝධ කරගැනීමට හැකි මානසික මට්ටමක් නොමැති නිසා එවන් ගිවිසුම් වලංගු නැත.

3) බීමත් පුද්ගලයන්

ගිවිසුමකට එලඹෙන අවස්ථාවේදී එම ගිවිසුමට සම්බන්ධ යම් පාර්ශවයක් බීමත්ව සිටියේ නම් ඒ අවස්ථාවේදී තමා විසින් එලඹෙන ගිවිසුමේ ස්වභාවය සහ ප්‍රතිපලය අවබෝධ කරගැනීමට හැකි මානසික මට්ටමක් නොමැති නිසා එවන් ගිවිසුම් වලංගු නැත. එහෙත් එලෙස මත්වීම ස්වකීය කැමැත්තට විරුද්ධව සිදුවී තිබිය යුතු අතර, ගිවිසුමේ අනෙක් පාර්ශවය විසින් ඒ බව දැන දැනම එලෙස බීමත් පුද්ගලයා සමග ගිවිසුමට එලඹ තිබිය යුතුය.

තමා මත්වී සිටියදී එලුණු ගිවිසුමක්, පියවි සිහියට එලඹි පසුව අනුමත කිරීමේ අයිතියක් එලෙස මත්වී ගිවිසුමට එලඹි පුද්ගලයාට ඇත.

## ගිවිසුමක් ඉටුකිරීමට ඇති හැකියාව

නීතියට අනුව වලංගු ගිවිසුමක් ඇතිවීමට නම්, එකී ගිවිසුම ඉටු කළ හැකි එකක් විය යුතුය.

පහත උදාහරණය සලකන්න.

ඒ සහ බී ගිවිසුමකට එළඹෙන්නේ ඒ විසින් පෝක් සමුද්‍ර සන්ධිය හරහා පයින් ඇවිද ගියහොත්, බී විසින් ඒ ට රුපියල් මිලියනයක් ලබා දෙන බවයි. මෙම ගිවිසුම ඉටුකිරීම කළ නොහැක්කක් බව ඉතා පැහැදිලි බැවින් මෙය නීතිය හමුවේ වලංගු ගිවිසුමක් නොවේ.

## ගිවිසුමේ අරමුණු නීත්‍යානුකූල වීම

නීතියට අනුව වලංගු ගිවිසුමක් ඇතිවීමට නම් එහි පරමාර්ථ නීත්‍යානුකූල විය යුතුය. මෙය කොටස් දෙකක් යටතේ අධ්‍යයනය කෙරේ.

1) ව්‍යවස්ථාවෙන් අනීතික ගිවිසුම්

2)පොදු නීතිය යටතේ අනීතික වන ගිවිසුම් -

- අපරාධයක් කිරීම සඳහා වන ගිවිසුමක්
- ලිංගික දුරාචාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වන ගිවිසුමක්
- ජන ජීවිතය තුල දූෂණය ප්‍රවර්ධනය කිරීමට ඇතිකරගත් ගිවිසුමක්
- යුක්තියේ නිසි පාලනයට අගතිකාරී වන ගිවිසුමක්
- ආදායම් වංචා කිරීම සඳහා ඇතිකරගත් ගිවිසුමක්

## විවිධ ගිවිසුම් වර්ග

<u>ක්‍රියාත්මක කල නොහැකි ගිවිසුම්</u>

මෙලෙස හැඳින්වෙන්නේ යම් තාක්ෂණික දෝෂයක් හේතුවෙන් ක්‍රියාත්මක කල නොහැකි ගිවිසුම් ය.

උදා - ලිඛිත නොවන ඉඩම් විකිණීමේ ගිවිසුමක්

<u>අවලංගු ( හිස් ) ගිවිසුම්/ ශූන්‍ය ගිවිසුම්</u>

මෙලෙස හැඳින්වෙන්නේ ආරම්භයේ පටන්ම බලරහිත ගිවිසුම්ය. එවන් ආකාරයේ ගිවිසුම් කිසිඳු නෛතික ප්‍රතිපලයක් ඇති නොකරයි. ඒ අනුව පාර්ශවයන් එවන් ගිවිසුමකින් බැඳී නැත.

උදා - වැරදීම මත ඇතිවූ ගිවිසුම්, නීතිවිරෝධී ගිවිසුම්, මහජන ප්‍රතිපත්තියට පටහැනි ගිවිසුම්

<u>අවලංගු කල හැකි ( හිස් කල හැකි ) ගිවිසුම්</u>

මෙවන් ගිවිසුම් ආරම්භයේදී වලංගු වන අතර ගිවිසුමට ඇතුලත් වූ එක් පාර්ශවයකට තම අභිමතය මත එම ගිවිසුම අවලංගු කරවා ගත හැකිය.

උදා - අත්‍යාවශ්‍ය නොවන භාන්ඩ මිලදී ගැනීමක් සඳහා බාලවයසුකරුවෙකු ඇතුලත්වූ ගිවිසුමක්, ගිවිසුමේ එක් පාර්ශවයක් තර්ජනය මත එම ගිවිසුමට එලඹ ඇති විට

## ගිවිසුමක් අවසන් කිරීම

පහත සඳහන් ක්‍රම වලට ගිවිසුමක් අවසන් විය හැකිය.

1) ඉටුකිරීමෙන්

ගිවිසුමක පාර්ශවයන් විසින් එම ගිවිසුම මත තම තමන්ට ඇති වගකීම් ඉටුකල පසු පාර්ශවයන් එම ගිවිසුම සම්බන්ධයෙන් තිබූ බැඳීම් වලින් නිදහස් වෙති.

2) කඩකිරීමෙන්

එක් පාර්ශවයක් විසින් ගිවිසුමේ කොන්දේසියක් කඩකිරීමෙන්ද ගිවිසුම අවසන් වේ. ගිවිසුම එලෙස කඩකරන පාර්ශවයට එරෙහිව නඩු පවරා එලෙස ගිවිසුම කඩ කිරීම මත තමන්ට සිදුවූ පාඩුව සඳහා වන්දි අයකර ගැනීමේ අයිතියක් නිර්දෝෂී පාර්ශවයට හෙවත් අහිංසක පාර්ශවයට ඇත. අහිංසක පාර්ශවය යනු ගිවිසුම කඩවීමට ලක්වූ පාර්ශවයයි.නමුත් ගිවිසුමත ප්‍රතිඥාභාරයක් කඩ වූ විට .............

..........................................................................................................................................................

..........................................................................................................................................................

3) අනයෝන්‍ය එකඟතාවයෙන්

ගිවිසුම නිමාවීමට පෙර ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ අනයෝන්‍ය එකඟතාවය මතද ගිවිසුමක් අවසන් කල හැකිය. උදා - ඒ සහ බී ගිවිසුමකට එලඹෙන්නේ ඒ ගේ හෝටලය සඳහා මාසිකව රතු සීනි කිලෝ දස දහස බැගින් වසර දෙකක් පුරාවටම බී විසින් සැපයීමටත්, ඒ විසින් ඊට නිසි පරිදි මුදල් ගෙවීමටත් යැයි සිතන්න. ඒ සහ බී යන දෙදෙනාගේම එකඟතාවය මත අවශ්‍ය නම් මෙම ගිවිසුම අදාල වසර දෙකේ කාලසීමාවට පෙර අවසන් කල හැකිය. නමුත් ඊට එම පාර්ශවකරුවන් දෙදෙනාගේම කැමැත්ත අවශ්‍ය වේ.

4) දැන්වීමක් මගින් අවසන් කිරීම

සමහර ගිවිසුම්වල කොන්දේසියක් ලෙස ගිවිසුම ඉටුකිරීමට පෙර ගිවිසුමට සම්බන්ධ එක් පාර්ශවයක් විසින් අනෙක් පාර්ශවය වෙත යම් නිශ්චිත කාලසීමාවකට පෙර සිදුකරනු ලබන දැනුම් දීමක් මගින් ගිවිසුම අවසන් කිරීමට අවසර දෙන වගන්තීන් දැකිය හැකිය. උදා - බදු ඔප්පු වල සාමාන්‍යයෙන් 'මෙම බදු ගිවිසුමේ එක් පාර්ශවයක් විසින් අනෙක් පාර්ශවය වෙත මාස තුනකට පෙරාතුව කරනු ලබන පූර්ව දැනුම් දීමක් මගින් මෙම බදු ගිවිසුම අවසන් කිරීමේ හැකියාව මෙම බදු ගිවිසුමේ දෙපාර්ශවයටම ඇති බව මෙහි දෙපාර්ශවය විසින්ම පිලිගනී ' ආකාරයේ මෙවන් වගන්තීන් දැකිය හැකිය.

5) අපේක්ෂිත කඩකිරීමක් මගින් අවසන් වීම

මින් අදහස් වන්නේ ගිවිසුම ඉටුකල යුතු නියම වේලාවට පෙර එම ගිවිසුමට සම්බන්ධ යම් පාර්ශවයක් විසින් අනෙක් පාර්ශවය වෙත තමන් මෙම ගිවිසුම ඉටු නොකර සිටීමට අපේක්ෂා කරන බව එනම්, ගිවිසුම කඩ කිරීමට අපේක්ෂා කරන බව කල් තියාම සන්නිවේදනය කිරීමයි.



JMCVLearning "Your virtual learning partner"

අපේක්ෂිත කඩවීමක් සිදුවූ විට ඒ පිලිබඳව නඩු පැවරීම සඳහා නිර්දෝශී පාර්ශවයට ගිවිසුම ඉටුකිරීමේ නියමිත කාලය දක්වා බලා සිටීම අවශ්‍ය නැත. එම අපේක්ෂිත කඩවීම පිලිබඳව තමා වෙත නිසි පරිදි සන්නිවේදනය වූ වහාම අලාභ ඉල්ලා නඩු පැවරීමේ හැකියාව අහිංසක පාර්ශවය හට ඇත.

**<u>හොචෙස්ටර් එරෙහිව ඩී ලා ටුවර්</u>**

ජූනි 01 දා සිට බලපැවැත්වෙන පරිදි පණිවිඩකරුවෙකු ලෙස C ව සේවයේ යොදවා ගැනීමට B, C සමග ගිවිස ගත්තේය. එහෙත් මැයි 11 දා C ගේ සේවය තමන්ට අනවශ්‍ය බව B, C ට දන්වයි. අධිකරණය මෙහිදී තීරණය කලේ මෙම අපේක්ෂිත කඩ වීම මත නඩු පවරා වන්දි අයකර ගැනීමේ අයිතියක් C ට ඇති බවයි.

6) නීතිය ක්‍රියාත්මක වීමෙන්

- ගිවිසුමට සම්බන්ධ පාර්ශවයක් බුන්වත් වීමෙන්
- ගිවිසුමක් යටතේ අඩු අයිතියක් , වැඩි අයිතියක් සමග සංයෝජනය වීමෙන්

උදා - නිවසක් කුලියට ගත් අයෙක් එම කුලී කාලසීමාව ඉකුත්ව යාමට පෙර එම නිවස මිලදී ගැනීම. මෙහිදී මුලින් ඇතිවූ කුලී ගිවිසුම, පසුව ඇතිවූ විකුණුම් ගිවිසුම හේතුවෙන් අවසන් වේ.

7) ව්‍යර්ථවීමෙන්

ව්‍යර්ථ වීමක් යනු ගිවිසුමට සම්බන්ධ කුමන පාර්ශවයක හෝ වරදකින් තොරව එකී ගිවිසුම ඉටු කල නොහැකි බවට පත් වීමයි. ව්‍යර්ථවීමක් මත ගිවිසුමක් අවසන් වීමකදී ගිවිසුමට සම්බන්ධ පාර්ශවයන් එකී ගිවිසුම මත ඇති බැඳීම් වලින් නිදහස් වෙති. ඊට හේතුව වන්නේ එහිදී ගිවිසුම ඉටුකල නොහැකි වන්නේ පාර්ශවයන්ගේ වරදකින් තොරව වන බැවිනි.

**<u>ටේලර් එරෙහිව කැඩ්වෙල්</u>** - අයෙකු විසින් ප්‍රසංගයක් පැවැත්වීම සඳහා සංගීත ශාලාවක් කුලියට ගත්තේය. එහෙත් ප්‍රසංගය පැවැත්වීමට පෙර දින එම ශාලාව ගින්නක් හේතුවෙන් විනාශ විය. මේ වන විට ශාලාව කුලියට ගත් අය එම ප්‍රසංගය වෙනුවෙන් යම් විදමක් දරා තිබූ අතර එය වන්දියක් ලෙස ඉල්ලා සිටියේය.

අධිකරණය මෙහිදී තීරණය කළේ මෙම ගිවිසුම ඉටු කිරීමට නොහැකි වූයේ එම ගිවිසුමට සම්බන්ධ එකදු පාර්ශවයක හෝ වරදකින් නොවන නිසා බැවින්, එනම් මෙම ගිවිසුම ව්‍යර්ථ වීම මත අවසන්ව ඇති බැවින් එලෙස වන්දි ඉල්ලා සිටීමට හිමිකමක් නොමැති බවයි.

**<u>ක්රෙල්ඩ් එ. හෙන්රි</u>** - හත් වන එඩ්වඩ් රජුගේ ඔටුණු පැළඳීමේ මංගල්‍යය වඩාත් පහසුවෙන් නැරඹීම සඳහා අයෙක් එක්තරා හෝටලයක කාමරයක් කුලියට ගත් නමුත් රජු හදිසියේම රෝගාතුර වීම නිසා එම උත්සවය දින නියමයක් නොමැතිව කල් දැමුණි. අදාල කාමර කුලිය අය කරගැනීම සඳහා පැවරූ මෙම නඩුවේදී අධිකරණය තීරණය කළේ මෙම ගිවිසුම ව්‍යර්ථ වීම මත අවසන්ව ඇති නිසා එලෙස කුලිය අයකර ගැනීමට හැකියාවක් නොමැති බවයි.

## <u>ගිවිසුම් කඩවීමකදී ගිවිසුම කඩ කල පාර්ශවයට විරුද්ධව අහිංසක පාර්ශවයට ගතහැකි පිලියම්</u>

1) ගිවිසුම කඩවීමෙන් සිදුවූ හානි සඳහා වන්දි ඉල්ලා නඩු පැවරීම

2) ගිවිසුම තවදුරටත් ඉටුකිරීම ප්‍රතික්ෂේප කිරීම.

ගිවිසුමක කොන්දේසියක් කඩවී ඇත්නම්, එලෙස කඩවූ පාර්ශවයට එකී ගිවිසුම මත තමාගේ බැඳීම් තවදුරටත් ඉටු නොකර සිටීමට ඇති අයිතිය මින් අදහස් වේ.

3) නිරූපිත ඉටුකිරීම / එපරිදිම ඉටුකිරීම / එලෙසම ඉටුකිරීම

මින් අදහස් වන්නේ ගිවිසුම කඩ කල පාර්ශවයට විරුද්ධව නඩු පවරා ගිවිසුමෙහි නිරූපනය වන ආකාරයටම එකී ගිවිසුම ඉටුකරන ලෙසට අධිකරණමය නියෝගයක් ලබා ගැනීමට ගිවිසුම කඩ වූ පාර්ශවයට හෙවත් අහිංසක පාර්ශවයට ඇති හැකියාවයි.

4) වාරණ නියෝගයක් ( ඉන්ජන්ෂන් ආඥාවක් ) හෙවත් නිරෝධාඥාවක් ලබාගැනීම

වාරණය යන වචනයේ අර්ථය තහනම් කිරීම යි. ගිවිසුමකට සම්බන්ධ යම් පාර්ශවයක් විසින් එකී ගිවිසුම කඩ කරමින් කටයුතු කරන අවස්ථාවකදී අධිකරණය වෙතින් වාරණ ආඥාවක් ලබා ගත හැකිය. පහත සඳහන් වන්නේ ඒ සඳහා උදාහරණ නඩු තීන්දුවකි.

<u>**වෝනර් බ්‍රදර් පික්චර්ස් එරෙහිව ඉන්ගෝලියා**</u> - එක්තරා ගායිකාවක් වෝනර් බ්‍රදර් පික්චර්ස් ආයතනය සමග ගීත ගායනා කිරීමට ගිවිසුමකට එළඹුණි. එම ආයතනයත් සමග ආරවුලක් ඇතිකර ගැනීමෙන් පසුව ඇය එම ගිවිසුම කඩ කොට ඕස්ට්‍රේලියාව බලා ගොස් එහි ගීත ගායනා කිරීම ආරම්භ කළාය. අධිකරණය මෙහිදී තීරණය කළේ ඇය සහ වෝනර් බ්‍රදර්ස් ආයතනය අතර ඇතිවූ ගිවිසුම ඇය විසින් කඩ කර ඇති බැවින් ඇය ඕස්ට්‍රේලියාවේ රඟහලක ගීත ගායනා කිරීම වැලැක්වීම සඳහා වාරණ නියෝගයක් නිකුත් කිරීම කළ හැකි බවයි.

5) කොන්ටම් මෙරූට් ( Qïntum Meruit ) යන සංකල්පය යටතේ නඩු පැවරීම.

මෙහි අර්ථය නම් ගිවිසුමක යම් පාර්ශවකරුවෙකු එහි අනෙක් පාර්ශවකරුට වාසිදායක වන යම් කාර්යක් සිදු කර ඇති විට එම පදනම මත එකී අනෙක් පාර්ශවකරු වෙතින් තමන් විසින් සිදු කරන ලද එකී වාසිදායක ක්‍රියාව වෙනුවෙන් වන්දි මුදලක් ලබාගැනීමේ හිමිකම එකී පලමු පාර්ශවකරුට ඇති බවයි.

උදා - ගිවිසුමක යම් පාර්ශවයක් විසින් එකී ගිවිසුම ප්‍රකාරව ඉෂ්ට කල යුතු කාර්යයෙන් කොටසක් පමණක් ඉටු කොට, ඉතිරිය ඉටුකිරීම ප්‍රතික්ෂේප කර ඇත් නම්, එලෙස ඉටුකර ඇති කාර්යය උදෙසා පමණක් ප්‍රමාණාත්මක ගෙවීමක් ලබා ගැනීමට අදාල පාර්ශවයට ඇත.

6) අයථා ධන ලාභ යටතේ සහන ඉල්ලීම

අයුතු ලෙස ධනවත් වීමට කිසිවෙකුටත් නීතියෙන් ඉඩක් නැත. ඇන්ඩන්ට අනුව යමෙකු තවත් අයෙකුගේ වියදමෙන් අයතු සහගත ලෙස පොහොසත් වුවහොත්, අදාල පාඩුව ලැබූ පාර්ශවය ව එම ගිවිසුමට එලඹීමට පෙර සිටි පූර්ව මූල්‍ය තත්වයට පත් කල යුතුය.

මෙම සංකල්පය යටතේ සහන ප්‍රදානය කිරීම සඳහා සාමාන්‍යයෙන් පහත කරුණු තෘප්ත කල යුතුය.

◆ වන්දි ලබා ගැනීමට අපේක්ෂා කරන නිර්දෝෂී පාර්ශවකරු වටිනා යමක් අනෙක් පාර්ශවකරු වෙත සපයා තිබිය යුතුය.

◆ නිර්දෝෂී පාර්ශවකරු විසින් සපයනු ලැබ තිබෙන කුමන හෝ දෙයක් , පැහැර හැරීම කරනු ලැබූ පාර්ශවකරු විසින් ලැබුණු බව දන්වා , පිලිගෙන හෝ එම දෙයින් ප්‍රතිලාභ ලබා තිබිය යුතුය.

◆ නිර්දෝෂී පාර්ශවකරු විසින් සැපයූ ඕනෑම දෙයක් , පැහැර හැරීම කරන පාර්ශවකරු විසින් ගෙවීමක් නොකර භුක්ති විඳිම ,අසාධාරණ ක්‍රියාවක් විය යුතුය.

උදා - මෝටර් රථයක් විකිණීමට එකඟවීමේ ගිවිසුමකට එලඹි දෙපාර්ශවයක් අතර එහි අත්තිකාරම් මුදලක් ලෙස යම් මුදලක් හුවමාරු වී ඇත්නම් සහ අදාල විකිණීමේ ගනුදෙනුව සම්පූර්ණ වීමට ප්‍රථම එම මෝටර් රථය එකී දෙපාර්ශවයේම වරදකින් තොරව විනාශ වුවහොත්, මෙම සංකල්පය යටතේ අදාල අත්තිකිරම් මුදල ආපසු ඉල්ලා සිටීමේ අයිතිය එය ලබා දුන් පාර්ශවයට ඇත.

## ගිවිසුමක පෙරෙවිතාව පිලිබඳ මූලධර්මය / පෙරෙවිතාව පිලිබඳ වාදය

මින් අදහස් වන්නේ ගිවිසුමක් මත නඩු පැවරීමට අයිතිය ඇත්තේ එකී ගිවිසුමට සම්බන්ධ පාර්ශවයකට පමණක්ය යන්නයි.

උදා - ඒ විසින් බී ගේ වත්තේ මෙවර පොල් මුරයේ පොල් අස්වැන්න කැඩූ පසු බී විසින් සී ට රුපියල් ලක්ෂයක් ලබා දීමට ඒ සහ බී ගිවිස ගනී යැයි සිතන්න. ඒ විසින් අදාල පොල් අස්වැන්න කැඩූ පසු බී විසින් සී වෙත මුදල් ගෙවීම පැහැර හරියි නම්, බී ට විරුද්ධව ගිවිසුම් කඩ කිරීම යටතේ නඩු පැවරීමේ අයිතිය ඇත්තේ ………………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………………………
……….

……………………………………………………………………………………………………………………………
……….

**ඩන්ලොප් ටයර් සමාගම එ. සෙල්ෆ්රිජ්** - ඩන්ලොප් ටයර් විකිණීම සඳහා ඩන්ලොප් ටයර් සමාගම සහ එක්ස් අතර ඇතිවූ ගිවිසුමේ වැඩි දුරටත් සඳහන් වූයේ ඩන්ලොප් ටයර් සමාගමේ පූර්ව අනුමැතියකින් තොරව නිශ්චිත මිලකට වඩා අඩුවෙන් ඩන්ලොප් ටයර් නොවිකිණිය යුතු බවයි. එක්ස් වෙතින් ඩන්ලොප් ටයර් මිලදී ගත් සෙල්ෆ්රිජ්, එම නිශ්චිත මිලට වඩා අඩුවෙන් ඩන්ලොප් ටයර් විකුණුවේය. එලෙස අඩු මිලට විකිණීම තහනම් කිරීම සඳහා ඩන්ලොප් ටයර් සම්ගම විසින් මෙම නඩුව පැවරූ අතර අධිකරණය මෙහිදී ප්‍රකාශ කලේ සෙල්ෆ්රිජ්ට විරුද්ධව නඩු පැවරීමේ හැකියාවක් ඩන්ලොප් ටයර් සමාගමට නොමැති බවයි. ඊට හේතුව වූයේ ඩන්ලොප් ටයර් සමාගම සහ එක්ස් අතර ඇතිවූ ගිවිසුමේ, සෙල්ෆ්රිජ් පාර්ශවකරුවකු නොවීමයි.

## ගිවිසුමක කාලාවරෝධී කාල සීමාව

සමහර කාරනා සම්බන්ධයෙන් නඩු පැවරිය යුතු කාලසීමාවන් නීතිය මගින් දක්වා ඇත. මේ සම්බන්ධයෙන් අදාල වන ප්‍රධානතම ව්‍යවස්ථාපිත නීතිය වන්නේ කාලාවරෝධ ආඥා පනතයි. යම් නඩු නිමිත්තක් මත නඩු පැවරීමකදී කාලාවරෝධ කාල සීමාව ඉකුත්ව යාමට පෙර නඩු පැවරීමට ක්‍රියා කල යුතුය. පහත ඇත්තේ එවන් උදාහරණ කිහිපයකි.

ලිඛිත ගිවිසුම් කඩ වීමක් සම්බන්ධයෙන් → .....................................................................................

වාචික ගිවිසුම් කඩ වීමක් සම්බන්ධයෙන් → ....................................................................................

මූලික අයිතිවාසිකම් කඩ වීමක් සම්බන්ධයෙන් → ............................................................................

චෙක්පත් අගරු වීමක් සම්බන්ධයෙන් → .........................................................................................

## <u>වෙනත් වැදගත් කරුණු</u>

JMC vLearning "your virtual learning partner"

**<u>ගිවිසුම් නීතිය - ආදර්ශ ප්‍රශ්ණ</u>** (කෙටි පිලිතුරු සපයන්න)

1). විමල් තම කාර් රථය රුපියල් ලක්ෂ 50 කට අත්පිට මුදලට විකිණීමට අනුරට අර්පනය කරයි. පහත අවස්ථා වලදී වලංගු ගිවිසුමක් ඇතිවේද ?

I. අනුර එකී අර්පනය ප්‍රතිග්‍රහණය කරන්නේ මුලින් ලක්ෂ 30 ක්ද ඉතිරිය ලක්ෂ 5 බැගින් සමාන වාරික 04 කින්ද ගෙවීමට තමන් කැමති බව ප්‍රකාශ කරමිනි.

II. අනුර එම අර්පනය එකහෙලාම ප්‍රතික්ෂේප කරයි.

III. එම කාර් රථය ලක්ෂ 49 ක මුදලකට මිලදී ගැනීමට තමා කැමති බව අනුර පවසයි.

IV. විමල්ගේ අර්පනයට එකඟ වෙමින් එම කාර් රථය ලක්ෂ 50 ක අත්පිට මුදලට ලබාගැනීමට අනුර තම කැමැත්ත ප්‍රකාශ කරයි.

V. විමල් එම අර්පනය කරන අවස්ථාවේදී ඒ අසල සිටි ටිල්වින් රු. ලක්ෂ 50 ක මුදලකට එම කාර් රථය මිලදී ගැනීමට තමා කැමති බව විමල්ට පවසයි.

VI. විමල්ගේ අර්පනය 2017.10.30 දින උදෑසන 9.00 තෙක් විවෘතව පවතින බව සිතන්න. අනුර විසින් එකී අර්පනය 2017.11.01 දින උදෑසන 7.00 ට ප්‍රතිග්‍රහණය කරයි.

VII. විමල්ගේ අර්පනය විවෘතව පවතින කාලය අතරතුර එය අනුර විසින් ප්‍රතිග්‍රහණය කිරීමට පෙර විමල් විසින් සිය අර්පනය ඉල්ලා අස් කරගත් බව අනුරට දන්වයි. එසේ දැන්වීමෙන් පසුව අනුර විසින් විමල්ගේ අර්පනය ප්‍රතිග්‍රහණය කරන අතර අනුර එකහෙලාම කියා සිටින්නේ තමා වෙත විමල් විසින් ඉදිරිපත් කරන ලද මුල් අර්පනය වලංගු ( විවෘත ) යැයි ප්‍රකාශිත කාලය තුල තමා එම අර්පනය ප්‍රතිග්‍රහණය කර ඇති බැවින් තමා සහ විමල් අතර වලංගු ගිවිසුමක් සංස්ථාපනය වී ඇති බවයි.

VIII. විමල්ගේ අර්පනය විවෘතව පවතින කාලය තුල අනුර විසින් එය ප්‍රතිග්‍රහණය කිරීමට පෙර විමල් එම කාර් රථය රනිල්ට විකුණා ඇති බව තමාගේ විශ්වාසවන්ත මිතුරකු වන මහින්ද මාර්ගයෙන් අනුර දැනගනී. එසේ දැනගත් පසුවද තමා වෙත විමල් කළ අර්පනය තමා විසින් ප්‍රතිග්‍රහණය කරන බව අනුර විමල්ට පවසයි. විමල් සහ අනුර අතර එම කාර් රථය විකිණීම පිලිබඳව වලංගු ගිවිසුමක් හටගනීද ?

IX. විමල්ගේ අර්පනය පිලිබඳව අනුර කිසිත් නොපවසා නිහඬව සිටී.

X. විමල්ගේ අර්පනය අනුර විසින් " සිතින් පමණක් " ප්‍රතිග්‍රහණය කරන අතර ඒ පිලිබඳව තම ඥාති හිතමිත්‍රාදීන්ට අනුර විසින් පවසන නමුත් විමල්ට ඒ පිළිබඳව දැනුම් නොදේ.

XI. ඉහත 3 අවස්ථාවේදී අනුරගේ යෝජනාවට විමල් කැමති නොවේ යැයි සිතන්න. පසුව අනුර නැවතත් රරු. ලක්ෂ 50 ක මුදලකට එය මිලදී ගැනීමට කැමැත්ත ප්‍රකාශ කළහොත් අනුරට එකී කාර් රථය ලබා දීමට විමල් බැඳී සිටියිද ?

XII. ඉහත 4 අවස්ථාවේදී අනුරට කාර් රථය ලබාදීමට විමල් බැඳී සිටීද ?

XIII. ඉහත 3 අවස්ථාවේදී අනුර සමග එකී කාර් රථය විකිණීම සම්බන්ධයෙන් වලංගු භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් ඇතිකර ගැනීමට විමල්ට හැකියාව තිබේද ?

XIV. විමල් විසින් එකී අර්පනය සිදුකලේ තැපැල් මාර්ගයෙන් යැයි සිත්නන. ඔහු විසින් එකී අර්පනය සහිත ලිපිය 2017.10.25 දින තැපෑලට දැමූ අතර 2017.10.29 දින එය අනුර වෙත ලැබුන්. 2017.11.03 දින අනුර තම ප්‍රතිග්‍රහණය සහිත ලිපිය විමල් වෙත තැපැල් කළ අතර එය විමල්ට ලැබුනේ 2017.11.07 දින දීය. මේ අතර 2017.11 දින තම අර්පනය ඉල්ලා අස් කරගත් බවට වූ දැන්වීමක් සහිත ලිපියක් විමල් විසින් තැපෑලට දැමූ අතර එය අනුරට ලැබුනේ 2017.11.05 දින දීය. එම කාර් රථය විකිණීම සම්බන්ධයෙන් විමල් සහ අනුර අතර වලංගු ගිවිසුමක් ඇතිවී තිබේද ?

XV. විමල් තම අර්පනය විවෘතව පවතින කාලය පිලිබඳව තම අර්පනය තුල සඳහන් කර නොමැති නම්, එකී අර්පනය කොතරම් කාලයක් විවෘතව පවතීද ?

XVI. තම අර්පනය ප්‍රතිග්‍රහණය කිරීම ලියාපදිංචි තැපෑලෙන් කරන ලෙස විමල් තම අර්පනය තුලින්ම ඉල්ලා සීටී. අනුර විසින් එය විද්‍යුත් තැපෑලෙන් ප්‍රතිග්‍රහණය කරයි.

2) අර්පනයක් ප්‍රතිග්‍රහණය කිරීමෙන් වලංගු ගිවිසුමක් හටගනී. පහත අවස්ථා වලදී වලංගු ගිවිසුමක් හටගන්නේදැයි පැහැදිලි කරන්න.

අ) රට සාමාන්‍ය තත්වයට පත්වන තෙක් තමාගේ නිවස මසකට රුපියල් 5000/- ක මුදලකට සමන්ට කුලියට දීමට කසුන් එකඟ වෙයි.

ආ) සමන් සහ කසුන් අතර පෝනියෙකු විකිණීම සඳහා ඇතිවූ එකඟතාවයේදී සඳහන් වූයේ එම පෝනියා පෝනි තරඟ වලින් ජයග්‍රහණය කිරීමට තරම් වාසනාවන්ත සතෙකු වුවහොත් තවත් අතිරේක ලක්ෂ 10 ක මුදලක් ගෙවන බවයි.

ඇ) ප්‍රසිද්ධ නිලි කාජල් විසින් පාවිච්චි කළ භාණ්ඩ වෙන්දේසියේ විකිණීමට තීරණය කළ අතර ඊට සහභාගී වූ කමල් , කාජල්ගේ පාසල් ඇඳුමක් සඳහා රු. ලක්ෂයක ලංසුවක් තබා වෙන්දේසියේදී මිටිය පහත හෙලීමෙන් පසුව එම ලංසුව ඉල්ලා අස්කර ගනී.

ඈ) අසංක විසින් තමන්ගේ යල කන්නයේදී නෙලූ බීලූණු අස්වැන්න, කිලෝවක් රු. 50 බැගින් සසංකට විකිණීමට අර්පනය කළ අතර සසංක ඊට එකඟ වේ.

3) වයස අවුරුදු 16 ක් වූ සිරිපාල පරිඝනක අලෙවි ආයතනයක් වෙත ගොස්, නවීන පන්නයේ ලැප්ටොප් පරිඝනකයක් ණය පදනම මත ලබා ගත්තේ තවත් මාසයක කාලයකින් ඒ සඳහා මුදල් ගෙවන බවට එකඟ වෙමිනි. මෙම පරිඝනකය තොරතුරු තාක්ෂණ විෂය ධාරාව ඔස්සේ උසස් පෙළ හදාරණ සිරිපාලට ඉතා අත්‍යාවශ්‍ය දෙයකි.

අ) සිරිපාල විසින් එළඹි මෙම ගිවිසුම වලංගු ගිවිසුමක් වේද ?

ආ) අදාල වටිනාකම සිරිපාල වෙතින් අය කර ගැනිමට අදාල විකුණුම්කරුට අයිතියක් ඇත්ද ?

ඇ) සිරිපාල සතුව ඒ වන විටත් ලැප්ටොප් පරිඝනකයක් තිබේ යැයි සිතන්න. ඔහු එම ලැප්ටොප් යන්ත්‍රය මිලදී ගත්තේ තම පෙම්වතිය සමග ස්කයිප් තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වීම සඳහා වෙනනමම පරිඝනකයක අවශ්‍යතාවය ඔහුට ඇතිවීම මත නම්, ඔබගේ ඉහත අ) සහ ආ) කොටස් වල පිලිතුරු කෙසේ වෙනස් වේද ?

4) දාස විසින් සේනගෙන් රුපියල් ලක්ෂ 10 ක් ණයට ලබා ගත්තේය. පසුව දාස විසින් කියා සිටින්නේ සම්පූර්ණ ණය මුදල ලක්ෂ 5 ක් ලෙස සැලකීම සඳහා තමන් සමග ගිවිසුමකට නොඑළඹෙන්නේ නම් සේන වෙත කිසිදු මුදලක් නැවත නොගෙවන බවයි. ඒ අනුව සේන, දාස සමග එකී ගිවිසුමට එළඹුණි නම් එය වලංගු ගිවිසුමක් වේද ?

5) ශ්වේත රාත්‍රිය නමින් ප්‍රසංගයක්  ප්‍රසංගයක් පැවැත්වීම සඳහා ඒ නැමැති ප්‍රසංග සංවිධායක වරයෙක් බී නැමැති ගායකයෙක් සමග ගිවිසුමකට එළඹුණි. ගිවිසුම ප්‍රකාරව එම ප්‍රසංගය සතියක් මුලුල්ලේම පැවැත්වෙන අතර ඊට සතියකට පෙර පෙරහුරු ගායනා මාලාවක් පැවැත්වීමට නියමිතව තිබුණි. ඒ මෙම පෙරහුරු ගායනය සඳහා පැමිණියේ ප්‍රසංගයට දින තුනකට පෙරදීය. මෙම හේතුව මත තමා , බී සමග එළඹි එම ගිවිසුම අවසන් කිරීමට ඒ සැරසේ. ඒ ට එසේ ගිවිසුම අවසන් කළ හැකි දැයි බී ඔබෙන් විමසයි.

අ) විනිශ්චිත නඩු තීන්දුවක් ඇසුරින් බී ට උපදෙස් දෙන්න.

ආ) ඒ විසින් ප්‍රසංගයේ මුල් දින තුන සඳහා සහභාගී වීමක් නොකළේ නම් ඔබගේ ඉහත ( අ ) කොටසේ පිළිතුර කෙසේ වෙනස් වේද ?

ඇ) පෙරහුරු ගායනය සඳහා සතියක්ම නොකඩවාම සහභාගී වීම, මෙම ගිවිසුමේ කොන්දේසියක් ලෙස සැලකීමට දෙපාර්ශවය විසින් එකඟව තිබුණේ නම් ඔබගේ ඉහත ( අ ) කොටසේ පිළිතුර කෙසේ වෙනස් වේද ?

6) සුපර්සිටි නැමැති රෙදිපිළි විලාසිතාගිරයේ රථගාල වෙත යන ප්‍රසාද් එහි තම යතුරු පැදිය ගාල්කර ඒ සඳහා ටිකට් පතක් ලබාගෙන එතනින් පිටව යයි. නැවත යතුරු පැදිය ලබාගැනීම සඳහා පැමිණෙන ප්‍රසාද් ට දැකගත හැකිවන්නේ යතුරුපැදිය මත තිබූ තමාගේ හෙල්මටය සහ ජැකට්ටුව යමෙකු විසින් සොරාගෙන ඇති බවයි. මේ සම්බන්ධයෙන් අදාල බලධාරීන්ගෙන් විමසූ විට , රථගාලේ පැහැදිලිව දර්ශනය නොවන සේ ඈත කොනක ඉතා කුඩාවට සවිකර තිබූ " හෙල්මට් සහ ජැකට් සඳහා වගකියනු නොලැබේ" යනුවෙන් වන දැන්වීම් පුවරුවක් සහ අදාල රථගාලේ ගාස්තුව ගෙවීමේදී  නිකුත් කළ ප්‍රසාද් විසින් අත්සන් කර නොමැති ටිකට් පතෙහි පිටුපස පැත්තේ ඉතා කුඩා අකුරෙන් මුද්‍රණය කර ඇති "හෙල්මට් සහ ජැකට් සඳහා වගකියනු නොලැබේ" යනුවෙන් ඇති වාක්‍යය කොටස පෙන්වා දෙයි. තමාට සිදුවූ අලාභය , රථගාල් හිමිකරුගෙන් අයකර ගත හැකි දැයි ප්‍රසාද්ට උපදෙස් දෙන්න.

7) මැයි 01 දා සිට බලපැවැත්වෙන පරිදි තම ආයතනයේ පණිවිඩකරුවෙකු ලෙස කමල් ව සේවයේ යොදවා ගැනීමට සිරිල්,කමල් සමග ගිවිසුමකට එළඹියේය. එහෙත් තමාට කමල්ගේ සේවය අනවශ්‍ය බව සිරිල් විසින් අප්‍රේල් මස 10 දා කමල්ට දැන්වීය. ඒ වන විටත් කමල්, ඔහු එතෙක් කරමින් පැවති රැකියාවෙන්ද ඉවත්වී සිරිල්ගේ ආයතනය අසලින් නිවසක්ද කුලියට ගෙන තිබුණේ ඔහුගේ නව රැකියාවට එය මහත් අස්වැසිල්ලක් වනු ඇති සිතාය. කමල්ට මෙම සිදුවීමට අදාලව නීතියෙන් යම් සහනයක් ලබාගත හැකිදැයි විනිශ්චිත නඩු තීන්දුවක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

8) අභිනවයෙන් තේරීපත්වූ නව ජනාධිපති තුමාගේ දිව්රුම් දීමේ උත්සවය තවත් සති දෙකකින් පැවැත්වෙන බැවින් එය සියැසින් දැකගැනීම සඳහා අජිත් විසින් ක්වීන්ස් හෝටලයෙන් කාමරයක් කල් ඇතිවම වෙන් කලේය. එහෙත් හදිසියේ ඇතිවූ බෝම්බ පිපිරීමක් නිසා ජනපති දිව්රුම් උත්සවය දින නියමයක් නොමැතිව කල් ගියේය. අජිත් වෙනුවෙන්ම අදාල දිනයේදී තම හෝටලයේ කාමරයක් වෙන්කර තිබූ බව පවසමින් හෝටල් සමාගම විසින් අජිත්ගෙන් අදාල කුලී මුදල ඉල්ලා සිටී. එම මුදල ගෙවීමට අජිත් බැඳී සිටීදැයි විනිශ්චිත නඩු තීන්දුවක් ඇසුරෙන් අජිත්ට පැහැදිලි කරන්න.

9) රනිල් මහින්ද සමග ගිවිසුමකට එළඹියේ මහින්ද විසින් රනිල්ගේ අඹ වත්තේ සියලුම අඹ කඩා අවසන් වූ විගස රනිල් විසින් අනුර ට රුපියල් ලක්ෂයක් ගෙවන බවටයි. මහින්ද විසින් රනිල්ගේ වත්තතේ අඹ සියල්ල කඩා අවසන් කල නමුත් රනිල් විසින් කිසිදු මුදලක් අනුර ට නොගෙවයි. මෙම මුදල ඉල්ලා සිටීමේ නෛතික හිමිකමක් අනුරට පවතීදැයි විනිශ්චිත නඩු තීන්දුවක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

10) රවී යනු සංගීත ශාලා හිමිකරුවෙකි. අර්ජුන් යනු ප්‍රසංග සංවිධායකයෙකි. මැයි 10 වන දින ප්‍රසංගයක් පැවැත්වීම සඳහා අර්ජුන් විසින් රවීගෙන් එම ශාලාව කුලියට ගැනීම සඳහා ගිවිසුමකට එළඹුණි. එහෙත් මැයි 08 දින ඇතිවූ සුනාමි තත්වයක් හේතුවෙන් එම ශාලාව මුලුමනින්ම විනාශ විය. අදාල ප්‍රසංගය සාර්ථකව පැවැත්වීම සඳහා අර්ජුන් විසින් ඒ වන විටත් විශාල වියදමක් දරා තිබුණි. අර්ජුන්ට සිදුවූ අලාභය අයකර ගැනීම සඳහා ඔහු විසින් රවී ට විරුද්ධව නඩු පවරා ඇත. අසරණ රවී ඔබගෙන් උපදෙස් පතයි. විනිශ්චිත නඩු තීන්දුවක් ඇසුරෙන් රවීට උපදෙස් දෙන්න.

11) ගිවිසුමක් කඩවූ පසු අහිංසක පාර්ශවයට නීතිය මගින් ලබා ගත හැකි පිළියම් මොනවාද ?

12) ගිවිසුම් පෙරෙවිතාව පිළිබඳ වාදය යන්නෙන් කුමක් අදහස් වේද ?

13) නීතිය ක්‍රියාත්මක වීම මත ගිවිසුමක් අවසන් වන අවස්ථා මොනවාද ?

14) ගිවිසුමක් අවසන් වන විවිධ ක්‍රම මොනවාද ?

## <u>ගිවිසුම් නීතියට අදාල පසුගිය විභාග ප්‍රශ්ණ</u>

ආදර්ශ ප්‍රශ්ණ පත්‍රය -

2015 මාර්තු -

2015 සැප්තැම්බර් -

2016 මාර්තු -

2016 සැප්තැම්බර් -

2017 මාර්තු -

2017 සැප්තැම්බර් -

2018 මාර්තු -

2018 සැප්තැම්බර් -

2019 මාර්තු -

2019 සැප්තැම්බර් -

2020 මාර්තු -

2020 සැප්තැම්බර් -

JMC vLearning "your virtual learning partner"

JMC vLearning
"your virtual learning partner"